90 වන කාණ්ඩය
18 වන කලාපය

ඉරිදු
1970 සැප්තැම්බර් 13

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

නිල වාර්තාව

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 2548]

ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය: වාර්ෂික වාර්තාව (1964-65) [තී. 2553]

කල්තැබීමේ යෝජනාව [තී. 2588]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 90
இல. 18

ஞாயிற்றுக்கிழமை
13 செப்ரெம்பர் 1970

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

விஞக்களுக்கு வாய்மூல விடைகள் [ப. 2548]

இலங்கை தோற்பொருள் உற்பத்திக் கூட்டுத்தாபனம்: வருடாந்த அறிக்கை (1964-65) [ப. 2553]

ஒத்திவைப்புப் பிரேரணை [ப. 2588]

---

Volume 90
No. 18

Sunday
13th September 1970

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [Col. 2548]

CEYLON LEATHER PRODUCTS CORPORATION: ANNUAL REPORT (1964-65) [Col. 2553]

ADJOURNMENT MOTION [Col. 2588]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

## House of Representatives

**1970 සැප්තැම්බර් 13 වන ඉරිද,**

ஞாயிற்றுக்கிழமை, 13 செப்ரெம்பர் 1970

*Sunday, 13th September 1970*

---

පූ. භා. 10ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය.

சபை, மு. ப. 10 மணிக்குக் கூடியது.

*The House met at 10 a.m.*

---

**මන්ත්‍රී මණ්ඩලයේ ලේකම්**

*(சபைச் செயலதிகாரி)*

(The Clerk of the House)

In the absence of Mr. Speaker and Mr. Deputy Speaker, I call upon Mr. Deputy Chairman of Committees to take the Chair.

අනතුරුව කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා [සේනපාල සමරසේකර මයා.] මූලාසනාරූඪ විය.

*அதன் பிறகு, குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் [திரு. சேனபால சமரசேகர] தலைமை தாங்கினார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. SENAPALA SAMARASEKERA] *took the Chair.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

## PAPERS PRESENTED

1969-70 අංක 16 සහ 17 දරණ පරිපූරක ඇස්තමේන්තු.—[අග්‍රාමාත්‍ය, රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදන හා රැකී රක්ෂා ඇමති වෙනුවට ලක්ෂ්මන් ජයකොඩි මයා.]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

1967-68 සඳහා ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ වාර්ෂික වාර්තාව.—[කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති වෙනුවට ගරු එස්. ඩී. ආර්. ජයරත්න]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

වාචික පිළිතුරු

1969-70 අංක 18 සහ 19 දරණ පරිපූරක ඇස්තමේන්තු.—[ගරු මෛත්‍රීපාල සේනානායක.]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

வினாக்களுக்கு வாய்மூல விடைகள்

## ORAL ANSWERS TO QUESTIONS

**ගාල්ලේ ඩී. ඒ. නානායක්කාර මහතා : විශ්‍රාම වැටුප**

*திரு. டி. ஏ. நானயக்கார, காலி : உபகாரச் சம்பளம்*

**MR. D. A. NANAYAKKARA, GALLE : PENSION**

3. **ආචාර්ය ඩබ්ලිව්. දහනායක** (ගාල්ල)

*(கலாநிதி டபிள்யு. தஹநாயக்க—காலி)*

(Dr. W. Dahanayake—Galle)

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ගාල්ලේ ආරෝග්‍යශාලාවේ කසළ ශෝධක කම්කරු තනතුරින් 1969 ජූලි මාසයේදී විශ්‍රාම ලැබූ, ගාල්ලේ කලුවැල්ලේ අංක 80 දරණ ස්ථානයෙහි පදිංචි ඩී. ඒ. නානායක්කාර මහතාට ලැබිය යුතු සම්පූර්ණ විශ්‍රාම වැටුප මෙතෙක් ගෙවා නැති බව එතුමා දන්නේද? (ආ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා නානායක්කාර මහතාගේ සේවයට අදාළ තොරතුරු මෙතෙක් ඉදිරිපත් කර නැති බව එතුමා දන්නේද? (ඉ) (i) නානායක්කාර මහතාට ලැබිය යුතු මුදල් ලබාදීම පිණිසත්, (ii) ස්වකීය රාජකාරි කටයුතු සම්බන්ධයෙන් නොසැළකිල්ලෙන් ක්‍රියා කරන නිලධාරීන්ට විරුද්ධව ක්‍රියා කිරීම පිණිසත් එතුමා කවර පියවර ගැනීමට අදහස් කරන්නේද?

*பொது நிர்வாகம், உள்ளூராட்சி, உள்நாட்டு அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா : (அ) 1969 ஜூலை மாதத்தில் காலி மருத்துவமனையில் மலகூட வேலைத் தொழிலாளியாகவிருந்து இளைப்பாறியவரும் காலியில் கலுவெல்ல 80 ஆம் இலக்க இல்லத்தைச் சேர்ந்தவருமான திரு. டி. ஏ. நாணயக்காரவுக்கு இன்னும் உபகாரச் சம்பளம் வழங்கப்படவில்லையென்பதை அவர் அறிவாரா? (ஆ) சுகாதாரச் சேவை அதிகாரி திரு. நாணயக்காராவின் சேவை சம்*



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

பந்தமான விபரங்களை இதுவரை சமர்ப்பிக்கத்தவறிவிட்டாரென்பதை அவர் அறிவாரா? (இ) (i) திரு. நாணயக்காராவுக்குச் சேர வேண்டிய தொகையை வழங்கவும்; (ii) தமது கடமைகளைச் செய்யத்தவறிய உத்தியோகத்தர்கள் மீது நடவடிக்கை எடுக்கவும்; அவர் என்ன நடவடிக்கை எடுக்கக் கருதியுள்ளார்?

asked the Minister of Public Administration, Local Government and Home Affairs: (*a*) Is he aware that the full pension due to Mr. D. A. Nanayakkara of 80, Kaluwella, Galle, who retired from the post of conservancy labourer in the Galle Hospital, in July, 1969, has not yet been paid to him? (*b*) Is he aware that the Director of Health Services has failed so far to furnish the relevant particulars that deal with the service of Mr. Nanayakkara? (*c*) What action does he propose to take to: (i) grant Mr. Nanayakkara his dues; (ii) deal with officers who are negligent in the discharge of their duties?

**ගරු කේ. බී. රත්නායක (පාර්ලිමේන්තු කටයුතු සහ ක්‍රීඩා ඇමති—රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති වෙනුවට)**

*(கௌரவ கே. பி. ரத்நாயக்க—பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுக்கள் அமைச்சர்— பொது நிர்வாகம், உள்ளூராட்சி, உள்நாட்டு அலுவல்கள் அமைச்சர் சார்பாக)*

(The Hon. K. B. Ratnayake—Minister of Parliamentary Affairs and Sports—on behalf of the Minister of Public Administration, Local Government and Home Affairs)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) (i) මේ පිළිබඳව දැනට ක්‍රියාකරගෙන යනු ලැබේ. (ii) අදාල නිලධාරීන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ දෘෂ්ඨි පථයට අයත්ව සිටී. මෙම තොරතුරු සැපයීමේ ප්‍රමාදය එම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ අවධානයට යොමු කරවා ඇත.

**කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා**

*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*

(Mr. Deputy Chairman of Committees)

1 වන ප්‍රශ්නය.

**එස්. කේ. කේ. සූරියාරච්චි මයා. (කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. எஸ். கே. கே. சூரியாராச்சி—கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. S. K. K. Suriarachchi—Parliamentary Secretary to the Minister of Industries and Scientific Affairs)

මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමට සති 2ක් කල් ඉල්ලා සිටිනවා.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினாவை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

**කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා**

*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*

(Mr. Deputy Chairman of Committees)

2 වන ප්‍රශ්නය.

**සූරියාරච්චි මයා.**

*(திரு. சூரியாராச்சி)*

(Mr. Suriarachchi)

මෙම ප්‍රශ්නයටද පිළිතුරු දීමටද සති 2ක් කල් ඉල්ලා සිටිනවා.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினாவை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

### නින්තවූර්හි කෝනවත්ත පාලමේ වැඩ

*நிந்தாவூர்த் கோணவத்தைப் பாலம் கட்டும்வேலை*

### CONSTRUCTION OF KONAWATTE BRIDGE, NINTAVUR

4. **ආර්. ප්‍රේමදාස මයා.** (මැද කොළඹ පළමුවන—එම්. එම්. මුස්තාෆා මයා.—නින්තවූර්—වෙනුවට)

*(திரு. ஆர். பிரேமதாச—கொழும்பு மத்தி முதலாம் அங்கத்தவர்—ஜனாப் எம். எம். முஸ்தபா—நிந்தவூர்—சார்பாக)*

(Mr. R. Premadasa—First Colombo Central—on behalf of Mr. M. M. Mustapha—Nintavur)

වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) නින්තවූර් ඡන්ද කොට්ඨාශයේ කෝනවත්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාලමේ වැඩ කොතෙක් දුරට සම්පූර්ණ කර තිබේද? (ආ) මෙතෙක් කර තිබෙන වැඩ සඳහා කොපමණ මුදලක් වැය කර තිබේද? (ඉ) ගල්ඔය ග. නි. ස. මණ්ඩලය විසින් ඉකුත් මාසය තුළ මෙහි වැඩ අත්හිටුවා තිබෙන්නේ මන්ද? (ඊ) මෙම පාලමේ වැඩ ඉක්මණින් නිමකිරීමේ අටියෙන් වහාම එහි වැඩ යළි ඇරඹීමට ග. නි. ස. මණ්ඩලයට එතුමා නියෝග කරන්නේද?

*நீர்ப்பாசன, மின்சக்தி, பெருவீதி அமைச்சரைக் கேட்ட வினா: (அ) நிந்தவூர்த் தொகுதியிலுள்ள கோணவத்தைப் பாலம் கட்டும் வேலை தற்பொழுது எக்கட்டத்திலுள்ளது? (ஆ) இதுவரை, இவ்வேலைக்காக எவ்வளவு பணம் செலவழிக்கப்பட்டுள்ளது? (இ) கல்லோயா ஆ. ப. அ. சபை, கடந்த மாதம் இவ்வேலையை இடைநிறுத்தஞ் செய்ததேன்? (ஈ) இப்பாலத்தை விரைவில் கட்டி முடிக்கும் நோக்கத்துடன் ஆ. ப. அ. சபை உடனடியாக இவ்வேலையை மீண்டும் துவக்குமாறு அவர் பணிப்பாரா?*

asked the Minister of Irrigation, Power and Highways: (*a*) At what stage of completion is the work on the Konawatte Bridge in the Nintavur Electorate? (*b*) How much money has so far been spent on the work executed? (c) Why has the R. V. D. B., Gal Oya, suspended work for the last one month? (*d*) Will he instruct the R. V. D. B. to resume work immediately on this bridge with a view to completing the work on this bridge early?

**ගරු මෛත්‍රීපාල සේනානායක (වාරිමාර්ග, විදුලි බලය හා මහාමාර්ග ඇමති, වැඩ බලන රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු ඇමති සහ සභානායක)**

*(கௌரவ மைத்திரிபால சேனநாயக்க—நீர்ப்பாசன, மின்சக்தி, பெருவீதிகள் அமைச்சரும் பதில் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரும், சபை முதல்வரும்)*

(The Hon. Maithripala Senanayake—Minister of Irrigation, Power and Highways, Acting Minister of Defence & External Affairs and Leader of the House)

(අ) පාලම ඉදිකිරීමේ කටයුතු තවම අත්තිවාරම් අවස්ථාවේ ඇත. (ආ) ප්‍රවේශ මාර්ග වැඩි දියුණු කිරීම හා ද්‍රව්‍ය මිලදී ගැනීම ඇතුළු වියදම 1970 ජූලි මස අවසානය වන විට රුපියල්, 120,002.41 කි. (ඉ) මෙම ව්‍යාපාරය සඳහා සංශෝධිත ඇස්තමේන්තු පළාත් පාලන අමාත්‍යාංශයෙන් අනුමත කර නැති නිසා මේ වැඩ කරගෙන යාමට අවශ්‍ය අරමුදල් මණ්ඩලයට වෙන්කොට නොමැත. (ඊ) පළාත් පාලන අමාත්‍යාංශය විසින් ඇස්තමේන්තු සම්මත කර, අරමුදල් නිකුත් කර පසු යළිත් වැඩ ආරම්භ කරනු ලැබේ.

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්

*சபை அமர்வு*

SITTINGS OF THE HOUSE

පූ. භා. 10.06

**ගරු මෛත්‍රීපාල සේනානායක**

*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*

(The Hon. Majthripala Senanayeke)

මෙම යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යැමේදී මන්ත්‍රී මණ්ඩලය 1970 සැප්තැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10 වන තෙක් කල් තැබිය යුතුය; එදින සභා රැස්වීමේ කාලවේලා පූ. භා. 10 සිට දවල් 12 දක්වා විය යුතුය; දවල් 12 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම කල් තැබිය යුතුය."

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්ථාවර නියෝග අනුව සාමාන්‍යයෙන් රැස්වීම් යෙදී තිබෙන්නේ 26 වෙනිදාට සහ 27 වෙනිදාටයි. එහෙත් 26 වෙනිදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් නිසාත්, 24 වෙනිදා සවස්වරුවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය රැස්වන නිසාත්, 24 වෙනිදා උදය වරුවේ 10 සිට 12 වනතෙක් හා ඊට පසු 25 වෙනිදාත් රැස්වන්න අදහස් කර ගෙනයි, මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ.

**ජේ. ආර්. ජයවර්ධන මයා. (දකුණු කොළඹ පළමුවන)**

*(திரு. ஜே. ஆர். ஜயவர்தன—கொழும்பு தெற்கு முதலாம் அங்கத்தவர்)*

(Mr. J. R. Jayewardene—First Colombo South)

27 වෙනිදා රැස් වෙනවද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

නැහැ. ස්ථාවර නියෝග අනුව සාමාන්‍ය යෙන් රැස්විය යුත්තේ 26 වැනිදා සහ 27 වැනිදායි. ඒ වෙනුවට 24 වෙනිදා සහ 25 වෙනිදා රැස්වන්නටයි අදහස් කරන්නේ. 24 වෙනිදා සවස 2 ට ආණ්ඩු ක්‍රම සම්පාදක මණ්ඩලය රැස්වන නිසා, එදින උදය වරුවේ 10 සිට 12 දක්වා පමණක් රැස්වීම් පවත්වන්නටත්, 25 වෙනිදා උදේ 10 සිට රැස්වීම පවත්වන්නටත් අදහස් කර නවා. මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ 24 වෙනිදා උදේ 10 ට රැස්වී 12 වනතුරු රැස්වීම පවත්වන්නටයි.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය: වාර්ෂික වාර්තාව (1964-65)

*இலங்கை தோற்பொருள் உற்பத்திக் கூட்டுத் தாபனம்: வருடாந்த அறிக்கை (1964-65)*

## CEYLON LEATHER PRODUCTS CORPORATION : ANNUAL REPORT (1964-65)

**ගරු කේ. බී. රත්නායක (කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති වෙනුවට)**
*(கௌரவ கே. பி. ரத்நாயக்க—கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சர் சார்பாக)*
(The Hon. K. B. Ratnayake—on behalf of the Minister of Industries and Scientific Affairs)

"1957 අංක 49 දරණ රජයේ කාර්මික සංස්ථා පනතේ 30 (2) වැනි වගන්තිය යටතේ 1970. 9. 10 වැනි දින ඉදිරිපත් කරන ලද 1964-65 වර්ෂය සඳහා වූ ගිණුම් පරීක්ෂක වාර්තාව, ඔඩිටර් ජනරාල්වරයාගේ නිරීක්ෂණ, ලාභාලාභ ගිණුම හා ශේෂ පත්‍රය ඇතුළත් ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව අනුමත කළ යුතුය" සි මා යෝජනා කරනවා.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

පූ. භා. 10.8

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් වචන ස්වල්පයක්වත් නොකියාම බැහැ. අද අපට සාකච්ඡා කරන්නට සිදු වී තිබෙන්නේ 1964-65 වර්ෂය වෙනුවෙන් ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කළ වාර්තා වයි. 1964 අප්‍රේල් සිට 1965 මාර්තු දක්වා කාලය සඳහායි, එය ඉදිරිපත් කර තිබෙන්නේ. එයින් පෙනෙන්නේ මේ වාර්තාව ඉදිරිපත් කිරීමට අවුරුදු හයක් පමණ ප්‍රමාද වී තිබෙන බවයි. මේ සංයුක්ත මණ්ඩලයට ඇත්තේ එකම ෆැක්ටරිය යි. සංයුක්ත මණ්ඩලයේ සේවක පිරිසේ එකතුව හයසිය ගණනකට වැඩි වන්නේ නැහැ. එහෙත් උසස් නිලධාරීන් නම් රාශියක්ම ඉන්නවා. මෙම සංයුක්ත මණ්ඩලය මේ වාර්තාව ඉදිරිපත් කිරීමට අවුරුදු හයක පමණ කාලයක් ගෙන තිබෙන නිසා, මෙම ගරු සභාවේ වගකීම නියම අන්දමින් ඉටු කිරීමට බැරි වී තිබෙනවා. වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමට මේ තරම් ප්‍රමාද වෙනවා නම් එම සංයුක්ත මණ්ඩලයේ වැඩ කටයුතු කෙසේ කෙරෙනවාදැයි අප දැන ගන්නේ කොහොමද ? 1964-65 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කර ඇති මේ වාර්තාවේ සඳහන් කරුණු ගෙනහැර පාමින් විවේචන කරන විට, කාලෝචිත නොවන අන්දමට කෙරෙන්නට ඉඩ තිබෙනවා. එම නිසා මා සෑම ඇමතිවරයකුගෙන්ම ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා, විශේෂ සැලකිල්ලක් දක්වමින් මෙවැනි වාර්තා කලට වේලාවට ඉදිරිපත් කරවීමට කටයුතු කරන්නය කියා. එහෙම නැත්නම් මෙය විහිළුවක් වෙනවා. එම නිසා, මින් ඉදිරියටවත් කලට වේලාවට මේ වාර්තා ඉදිරිපත් කරවීමට කටයුතු කෙරෙනු ඇතැයි මා විශ්වාස කරනවා.

රජයේ ඒ ඒ දෙපාර්තමේන්තු සහ සංස්ථාවල කටයුතු ගැන පරීක්ෂා කර බැලීම සඳහා මේ ගරු සභාව රජයේ ගිණුම් කාරක සභාවක් —Public Accounts Committee —පත් කර තිබෙනවා. තම යුතුකම් ඉටු කිරීම පැහැර හරින මෙවැනි සංස්ථාවල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිලධාරීන් කැඳවා ඔවුන්ට තර්ජනය කර හෝ ඔවුන්ගේ යුතුකම් ඉටු කරවීමට කටයුතු සැලැස්වීම ඒ රජයේ ගිණුම් කාරක සභාවේ යුතුකමක් බව මේ අවස්ථාවේදී පෙන්වා දෙන්නට කැමතියි.

මේ වාර්තාවේ සඳහන් සමහර කරුණු ගැන විවේචනය කරන්නට අපට සිදු වුණත්, පසුගිය අවුරුදු පහ හය ඇතුළත ඒ තත්ත්වය වෙනස් වී තිබෙන්නට පුළුවන් නිසා අපේ විවේචන අදට නොගැලපෙන්නට පුළුවනි. මේ වාර්තාවේ 3 වැනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

"**අමු හම් සැපයීම:** වර්ෂයේ සමහර මාසවලදී අමු හම් සැපයීම එතරම් සතුටුදායකව නොකෙරුණි."

මේ තත්ත්වය දැන් සතුටුදායක අන්දමට වෙනස් වී තිබෙනවාද? තවමත් එවැනි අමුද්‍රව්‍ය සැපයීම සතුටුදායක තත්ත්වයකට පැමිණ නැත්නම් පසුගිය අවුරුදු පහ හය තුළ ඒ සඳහා කටයුතු නොකළේ ඇයි? මෙම වාර්තාවේ තවත් තැනක සඳහන් වෙනවා "ක්‍රෝම්" —Chrome— නමැති හොඳ හම් වර්ගයේ හිඟයක් තිබෙනවාය කියා. දැන් ඒවා හිඟ නැතිව ලබා ගන්නට පුළුවන්ද? සපත්තු ආදිය නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය එවැනි අමු ද්‍රව්‍ය වුව මනා තරමට ලබා ගැනීම සඳහා පසුගිය කාලය තුළ සාර්ථක වැඩ පිළිවෙළක් අනුගමනය කර තිබෙනවාද? මේ සංස්ථාවේ නිෂ්පාදන මිළ දී ගැනීමට පිටරටවල් පවා උනන්දුවක් දක්වන බවට අපට ආරංචි ලැබී තිබෙනවා. එහෙත් අවශ්‍ය පමණට අමුද්‍රව්‍ය සපයා ගන්නට පුළුවන්කමක් නැත්නම් එම ඉල්ලීම් සපුරාලන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයට අවශ්‍ය අමු ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා එම සංයුක්ත මණ්ඩලයේම ක්‍රියාකාරී අංශයක් හැටියට වෙනම අංශයක් ඇති කර එහි පාලනයත් එම සංයුක්ත මණ්ඩලයට අයත් රාජකාරියක් හැටියට ඇතුළත් කර ගනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. මා හිතන්නේ දැන් පවතින තත්ත්වය අනුව සංයුක්ත මණ්ඩලයට අවශ්‍ය අමු ද්‍රව්‍ය ලබා ගන්නේ නම් යම් යම් පුද්ගලයන්ගෙන්ය කියා. එවැනි තත්ත්වයක් පවතිනවා නම් එය කිසිසේත් සතුටුදායක නැහැ. සමහර විට මෙය සිදු වන්නේ අහම්බෙන් වෙන්නටත් පුළුවනි. එම නිසා සංයුක්ත මණ්ඩලයට අවශ්‍ය අමු ද්‍රව්‍ය සැහෙන ප්‍රමාණයක් ලබා ගැනීම පිණිස කවර ස්ථිර වැඩ පිළිවෙළක් අනුගමනය කරන්නට බලාපොරොත්තු වෙනවාදැයි මම අහන්නට කැමතියි.

පූ. භා. 10.18

**ජේ. ඩී. වීරසේකර මයා.** (කොත්මලේ)
*(திரு. ஜே. டீ. வீரசேகர—கொத்மலை)*
**(Mr. J. D. Weerasekera—Kotmale)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වාර්තාව බොහොම ප්‍රමාද වෙලා ඉදිරිපත් කර තිබෙන බව මා පිළිගන්නවා. 1964-65 වර්ෂය සඳහා වූ වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නේ අවුරුදු 6 කට පසුව බව අපට පෙනෙනවා. ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය වෙළඳ ආයතනයක්. වෙළඳ ආයතනයකින් ලාභ ලැබෙනවාද, පාඩු වෙනවාද යන්න රටටත් මහජනයාටත් හැකිතාක් ඉක්මණින් දැනගන්නට පුළුවන් වන විධියේ වැඩ පිළිවෙලක් ඇති කළ යුතුයි.

මේ සංයුක්ත මණ්ඩලයේ වැදගත් වෙනසක් ඇති කර තිබෙනවා. සංයුක්ත මණ්ඩලයේ වැඩ කරන කම්කරුවන් සමග සාකච්ඡා කිරීම සඳහා උපදේශක මණ්ඩල වැනි දේ ඇති කර තිබෙනවා. ඒවා ඉදිරියටත් පවත්වාගෙන යන්නට ඕනෑ. ඔය සංයුක්ත මණ්ඩලයේ පමණක් නොව අනෙකුත් සංයුක්ත මණ්ඩලවලත් එවැනි මණ්ඩල පිහිටුවා ගන්නට ඕනෑ. එය ඉතා අවශ්‍ය අංගයක් හැටියට තිබෙන්නට ඕනෑ. ඔය වාගේ ආයතනයක—කර්මාන්තශාලාවක—පාලක පක්ෂය මෙන්ම කම්කරුවන්ගේ වෘත්තිය සමිති සංවිධානද එකට එකතු වී සහයෝගයෙන් කටයුතු කෙරෙන තත්ත්වයක් ඇති විය යුතුයි. පාලක පක්ෂයත් කම්කරු පිරිසත් අතර ඉතා උසස් මට්ටමේ විශ්වාසයක් ඇතිව වැඩ කළොත් පමණයි ඒවා නිසියාකාරයෙන් මෙන්ම ප්‍රයෝජනවත් ලෙසත් ක්‍රියාත්මක වන්නේ. මේ ආයතනවලින් වැඩි ලාභයක් ලබා ගන්නට පුළුවන් වන්නේ දෙපක්ෂයේම අන්‍යෝන්‍ය සහයෝගය තිබෙන ප්‍රමාණය අනුවයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. ඩී. වීරසේකර මයා.]

මෙවැනි ආයතන ද්‍රව්‍ය නිෂ්පාදනය කරන ආයතන මෙන් ම ඒවා අලෙවි කරන ආයතනත් බව අපි දන්නවා. මෙවැනි ආයතනවලින් ලබා ගන්නට පුළුවන් ඉහළම ප්‍රයෝජනය ලබා ගන්නට ඕනෑ. ලාභයකුත් ඇතිව මේවා පවත්වාගෙන යන්නට පුළුවනි. මගේ කල්පනාවේ හැටියට පසුගිය කාලය තුළ මේ ආයතනය වැඩ කරගෙන ගිය අන්දම ගැන අපට අසතුටු වන්නට බැහැ. මා එසේ කියන්නේ වැදගත් තොරතුරු අනුවයි. පසුගිය කාලයේ මේ ආයතනයෙන් නිෂ්පාදනය කරන ලද ද්‍රව්‍ය හෙවත් සපත්තු සැලකිය යුතු ප්‍රමාණයක් සෝවියට් දේශයටත් පටවා යවා තිබෙනවා. එපමණක් නොව, මා දන්නා හැටියට, දැන් මේ සංයුක්ත මණ්ඩලයේ වැඩ කටයුතුත් පුළුල් කර තිබෙනවා. සපත්තු පමණක් නොව පටි වැනි වෙනත් දේත් මේ සංයුක්ත මණ්ඩලයෙන් දැන් නිෂ්පාදනය වෙනවා. එය සුබ ලකුණක් හැටියට සලකන්නට පුළුවනි. ඒ අතරම වෙනත් අවශ්‍ය භාණ්ඩ ගැනත් කල්පනා කර බලා ඒ හැම දෙයක්ම මෙම ආයතනයෙන් නිෂ්පාදනය කිරීමට උත්සාහ කරන්නට ඕනෑ. එසේ කළොත් අපේ රටට විශාල සේවයක් මේ වැදගත් ආයතනයෙන් ලබා දෙන්නට පුළුවනි. මුදල් අතින් අමාරු තත්ත්වයකට වැටී සිටින අපේ රටට මේ ආයතනයෙන් විශාල මුදල් සම්භාරයක්ද ලබා ගන්නට පුළුවන් වෙනවා. අපට ඉතාමත් අවශ්‍ය විදේශ විනිමය පවා මේ ආයතනයේ මාර්ගයෙන් අපට ලබා ගන්නට ඉඩකඩ තිබෙනවා.

ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය හැර තවත් සංයුක්ත මණ්ඩල රාශියක් ලංකාවේ තිබෙනවා. රජය මගින් පාලනය වන මේ සංයුක්ත මණ්ඩල හැම එකක් ගැනම කල්පනාව යොමු වන්නට ඕනෑ. අපට මේ ආයතනවලින් සැලකිය යුතු ලාභයක් ලැබෙන්නේ නැහැ. බොහොමයක් සංයුක්ත මණ්ඩලවලින් පාඩු සිදු වෙනවා. අපට සදාකාලිකවම මේ ආයතන පාඩු ලබමින් කරගෙන යන්නට පුළුවන්කමක් නැහැ. දැනටමත් මේ සංයුක්ත මණ්ඩලයේ පාලක පක්ෂය උනන්දුවක් දක්වා වැඩ කරගෙන යනවා. මෙය රජයේ ආයතනයක් හැටියට පමණක් හිතන්නේ නැතිව වෙළඳ ආයතනයක් හැටියට සලකන්නට ඕනෑ. ඕනෑම පෞද්ගලික වෙළඳ ආයතනයක් පවත්වාගෙන යන්නේ ප්‍රධාන බලාපොරොත්තුවක් හැටියට ලාභ ලැබීමටයි. හැම වෙළෙන්දෙක්ම පාහේ කටයුතු කරන්නෙත් ලාභ ලැබීමේ අදහස පෙරදැරි කරගෙනයි. රජයේ ආයතනවල සිටින හුඟක් දෙනා කල්පනා කරන්නේ රජයේ ආයතන නිසා ඒවායේ වැඩ ඕනෑ විධියකට කරන්නට පුළුවන්ය කියලයි. ඒවායින් පාඩු වුණත්, ලාභයක් ලැබුණත් කමක් නැතැයි සමහර අය හිතනවා. කල්පනා කරන්නට ඕනෑ එහෙම නොවෙයි. නිසි සැලැස්මවල් හදන්නට ඕනෑ. රජය මේ සම්බන්ධයෙන් තදින් සිටින්නට ඕනෑ. අපේ කර්මාන්තශාලාවලින් නිසි සේවයක් ලැබෙන පරිදිත්, සෑහෙන ලාභයක් ලැබෙන අන්දමටත් විධිමත් සැලැස්මවල් සකස් කරන්නට ඕනෑ. එහෙම සකස් නොකරනවා නම් අපට මීටත් වඩා දරුණු තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වෙනවා ඇති.

මීට ඉස්සර වෙලා මේ රටේ තිබුණු ඇතැම් ආණ්ඩුවලින් හරියාකාර සැලැස්මවල් හදන්නේ නැතිව යම් යම් කර්මාන්තශාලා ඇති කර තිබෙන බවයි මා කල්පනා කරන්නේ. ඒ ඒ කාලවල හිටපු කර්මාන්ත ඇමතිවරුන් තම තමන්ගේ පෞද්ගලික අදහස් උඩ කර්මාන්තශාලා ආරම්භ කළා.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

කොයි කාලයේදීද?

**ජේ. ඩී. වීරසේකර මයා.**
*(திரு. ஜே. டீ. வீரசேகர)*
(Mr. J. D. Weerasekera)

තමුන්නාන්සේලාගේ කාලයේදී. පොන්නම්බලම් මහත්මයා කර්මාන්ත ඇමතිවරයා හැටියට හිටපු කාලයේදී. අපි දන්නවා පටන් ගත් අන්දම. අපේ ආණ්ඩුව නොවෙයි. යූ. එන්. පී. ආණ්ඩුවයි එය කළේ. යාපනේ සිමෙන්ති කම්හල ගැන අපි දන්නවා. එම වැඩ පිළිවෙළ හොඳයි. එහෙත් ඒ ගැන හරියාකාර සොයා බලා නැහැ. එවැනි කර්මාන්තශාලා පිහිටුවීමේදී වැඩිය සලකා බලා තිබෙන්නේ ඇමතිවරු ගැනයි. ඒවාගේමයි වාලච්චේනෙයිහි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කඩදාසි කම්හලත්. ඒ ගැනත් සොයා බලා නැහැ. එය විශාල පාඩු ගෙන දෙන තැනක් වී තිබෙනවා.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)
දැන් ඔක්කොම වාසියි.

**ජේ. ඩී. වීරසේකර මයා.**
(திரு. ஜே. டீ. வீரசேகர)
(Mr. J. D. Weerasekera)
මා දන්නේ නැහැ කොතරම් වාසිද කියා.

**ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන (කම්කරු ඇමති)**
(கௌரவ எம். பீ. டி சொய்சா சிரிவர்தன—தொழில் அமைச்சர்)
(The Hon. M. P. de Zoysa Siriwardena—Minister of Labour)
අපේ ආණ්ඩුව ආවායින් පස්සේ වාසි වන්නට ඇති.

**ජේ. ඩී. වීරසේකර මයා.**
(திரு. ஜே. டீ. வீரசேகர)
(Mr. J. D. Weerasekera)
අමු ද්‍රව්‍ය වැඩියෙන් තිබෙන පළාත් අනුව ඒ ඒ කර්මාන්ත ශාලා පිහිටුවන්නට කල්පනා නොකර යම් යම් ඇමතිවරුන්ගේ වුවමනා එපාකම් වල හැටියටයි වැඩ කර තිබෙන්නේ. ඒ අනුව ලංකාව කර්මාන්ත අතින් නිසියාකාර දියුණු කරන්නට අමාරුයි. යම්කිසි කර්මාන්ත ශාලාවක් පටන් ගන්නට පෙර ඊට අවශ්‍ය වන මූලික දෙයක් වූ අමු ද්‍රව්‍ය පිළිබඳව සලකන්නට ඕනෑ. එම ස්වාභාවික වස්තුව පහසුවෙන් ලබාගතහැකි තැන් පිළිබඳව පරීක්ෂා කර බලා ඉන් පසුවයි කර්මාන්ත ශාලාවක් පටන් ගතයුත්තේ. යම්කිසි කර්මාන්ත ශාලාවක් යම් තැනක පටන් ගත්තොත් එය එතන අවුරුදු සිය ගණනක් පවත්වා ගෙන යන්නට වෙනවා. එම නිසා එම ස්ථානයේ අවුරුදු කීයකට සෑහෙන්න අමු ද්‍රව්‍ය තිබෙනවාදැයි විමසා බැලිය යුතුයි. යමක් පටන් ගත්තාට පසු අමු ද්‍රව්‍ය නැතෙයි කියා වහන්නට බැහැ. අපි විශේෂයෙන් ලංකාවේ තිබෙන අමු ද්‍රව්‍ය පිළිබඳව කල්පනා කරන්නට ඕනෑ. විදේශ විනිමය අමාරු කාලයක යම්කිසි කර්මාන්ත ශාලාවක් පටන් ගන්නා විට දේශීය අමු ද්‍රව්‍ය පිළිබඳව වැඩිපුර සලකා බලන්නට ඕනෑ. අද අපේ රටේ කර්මාන්ත ශාලා පවත්වා ගෙන යන්නට අමාරු වී තිබෙන්නේ පිට රටින් අමු ද්‍රව්‍ය ගෙන්වන්නට සිදු වී තිබෙන නිසායි.

සෝවියට් දේශයේ ආධාර ඇතුව පටන් ගත් ටයර් කර්මාන්ත ශාලාව ගැන සිතා බලමු. එහි වැඩ කෙරෙන ආකාරය ගැන අපට දැන් සන්තෝෂ වන්නට බැහැ.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)
කවුද පටන් ගත්තේ ?

**ජේ. ඩී. වීරසේකර මයා.**
(திரு. ஜே. டீ. வீரசேகர)
(Mr. J. D. Weerasekera)
අපේ කාලේ. ඒක නරක වැඩක් නොවෙයි. එය ඉතා හොඳ කර්මාන්තයක්. පළමුවෙන්ම එහි නිපදවූ ටයර් පිටරටින් ගෙන්වන ඒවාටත් වැඩිය හොඳ තත්ත්වයක තිබුණා. එහෙත් අද තත්ත්වය ඊට වෙනස්. අද එහි නිපදවන ටයර් සතුටුදායක තත්ත්වයක නැහැ. පිටරටින් ටයර් ගෙන්වා ගන්නට සූදානමින් සිටින වෙළෙන්දන් වැනි උදවිය යම් යම් කූට උපක්‍රම යොදා මෙම කර්මාන්තය අඩපණ කරන්නට කල්පනා කරනවා විය හැකියි. එම නිසා මේවා ගැන නිසියාකාර සොයා බලා එවැනි අනතුරුවලින් එම කර්මාන්ත ව්‍යාපාර බේරා ගන්නට ඕනෑ. එම කර්මාන්තය පටන් ගත් අවධියේදී නිපදවූ ටයර් හොඳ වුණා නම් දැන් පමණක් නිපදවන ටයර් නරක් වන්නට හේතුව කුමක්ද ? ඊට මොකක්හරි හේතුවක් තිබිය යුතුයි. පටන් ගත් හැටියේම මෙහි නිපදවූටයර් පිටරටින් ගෙන්වන ටයර්වලටත් වඩා හොඳ තත්ත්වයක තිබුණු බව අපි දන්නවා. මෙවැනි දේ ගැන සොයා බලා දුර්වල තැන් නැති කර ගැනීමට සුදුසු ප්‍රතිකර්ම යොදාගෙන මෙවැනි කර්මාන්ත ශාලා ලාභ උපදවා දෙන ආකාරයට අපි සකස් කර ගන්නට ඕනෑ. එම නිසා මේවා ගැන නිසිපරිදි සොයා බලා නියමාකාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. ඩී. වීරසේකර මයා.]

යෙන් ලාභ ලබා ගැනීමට හැකි ආයතන හැටියට පරිවර්තනය කරන්නට සුදුසු පියවර ගන්නා මෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා මේ කරුණු සටහන් කර ගන්නා බව පෙනෙනවා. ඒ ගැන සන්තෝෂයි. මෙම කර්මාන්ත ශාලා මගින් අපේ රටට නියම ප්‍රතිඵල ලබා දීම සඳහා ඒවායේ නිෂ්පාදනය වැඩි කළයුතුයි. එසේ කිරීම සඳහා වැඩි පිරිසකට ඒවායේ රැකීරක්ෂා සපයා දෙන්නට පුළුවනි. එසේ කොට ඒවායේ සේවය කරන උදවියගේත් විශ්වාසය දිනා ගෙන කටයුතු කිරීම මෙවැනි කර්මාන්ත දියුණු කිරීමට එක් මාර්ගයක් වෙනවා. අඩු වශයෙන් සතියකට වරක්වත් පාලක පක්ෂයත් කම්කරු පක්ෂයත් අතර තම ආයතනයේ ඇති ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා පවත්වන්නට ඕනෑ. එසේ සාකච්ඡා පවත්වා එම කර්මාන්ත ශාලා ගමන් කරවන යම් ඉලක්කයක් ඇත්නම් ඒ ඉලක්කය කරා ඒවා ගමන් කරවීමට සුදුසු පරිදි ක්‍රියා කළ යුතුයි. ඒ සඳහා පාලක පක්ෂයත් කම්කරු පක්ෂයත් අතර සාකච්ඡා පවත්වා යම් යම් සැළැස්මවල් උඩ ඒවායේ නිෂ්පාදන වැඩි කළ යුතුයි. කම්කරුවන්ගේ විශ්වාසය දිනා ගෙන කටයුතු කරන විට ඒවායෙන් වැඩි පුර ලාභ ලැබුනොත් එම ලාභවලින් වැඩි ප්‍රමාණයක් ඔවුන් අතර බෙදා දීමෙන් තව දුරටත් ඔවුන්ගේ විශ්වාසය තහවුරු කර ගෙන ක්‍රියා කළ හැකියි. එසේ කළ විට අපට මීට වඩා හොඳ ප්‍රතිඵල මේවායින් ලබා ගන්නට පුළුවනි. අප මේ විධියට මේ අංශවල වැරදි සොයන්නේ කාටවත් දෙස් පැවරීමට නොව වෙළඳ ආයතන වශයෙන් මෙම කර්මාන්තශාලා නියම ආකාරයෙන් පවත්වාගෙන ගොස් නියම ප්‍රතිඵල ලබා ගන්න ඕනෑ නිසයි. මේ අවස්ථාවේදී නොයෙකුත් අලුත් දේවල් පටන් ගැනීමට අපට පුළුවන්කම තිබෙනවා. කොහු කර්මාන්තය මේ රටේ ඉතා වැදගත් තැනක් ගන්න කර්මාන්තයක්.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

මේ යෝජනාව ඉදිරිපත් වී තිබෙන්නේ සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය ගැනයි.

**ජේ. ඩී. වීරසේකර මයා.**
*(திரு. ஜே. டீ. வீரசேகர)*
(Mr. J. D. Weerasekera)

කර්මාන්ත හැම එකක්ම එකට සම්බන්ධවී තිබෙනවා. එක් කර්මාන්තයක් ගැන කතා කිරීමේදී අනෙක් කර්මාන්ත ගැනත් කල්පනා කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම පාතරට ප්‍රදේශවල කොහු කර්මාන්තයත් ඉතා වැදගත් තැනක් ගන්නවා. හොඳ ලණු පැදුරු, පාපිසි ආදිය බටහිර ජර්මනිය වැනි රටවලට යවන්න පුළුවන් වන නිසා විදේශ විනිමය සපයා ගැනීම අතින් මෙය ඉතා වැදගත් වෙනවා.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

තවත් මන්ත්‍රීවරුන් කීපදෙනකුම කතා කරන්න සිටින නිසා ගරු මන්ත්‍රීතුමා සම්භාණ්ඩ ගැන පමණක් කතා කරන්න.

**ජේ. ඩී. වීරසේකර මයා.**
*(திரு. ஜே. டீ. வீரசேகர)*
(Mr. J. D. Weerasekera)

සම් කර්මාන්තය මෙන්ම අනෙක් කර්මාන්තත් වැදගත් වෙනවා. වැඩිපුර විදේශ විනිමය ලබා ගැනීමට අප අදහස් කරනවා නම්, සම්භාණ්ඩ ගැන මෙන්ම අනෙක් කර්මාන්ත ගැනත් කල්පනා කරන්නට ඕනෑ. එම නිසා, සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය මෙන්ම අනෙක් අංශත් දැනට වඩා හොඳට පවත්වාගෙන යාමට කටයුතු යොදනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

පූ. භා. 10.25

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොත්මලේ මන්ත්‍රීතුමාගේ දේශනයේ සමහර අදහස්වලට මා හුඟක් දුරට එකඟ වෙනවා. එහෙත්, සංස්ථා දෙකක් ගැන පමණක් එතුමා දැක්වූ අදහස් මා පිළිගන්නේ නැ. සිමෙන්ති සංස්ථාව පළමුවෙන් යාපනයේ ආරම්භ කළේ ඊට අවශ්‍ය මැටි හා වෙනත් අමු ද්‍රව්‍ය ඒ පළාතේ තිබෙන නිසායි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙතෙක් ආණ්ඩු තුනක පාලනය යටතේ පැවති එම සංස්ථාව අද ඉතාම හොඳ සංස්ථාවක් හැටියට අපට පිළිගන්න පුළුවනි. ඒ වාගේම, කඩදාසි සංයුක්ත මණ්ඩලය මඩකලපුවේ පිහිටුවනු ලැබුවේ පිදුරු හා ඉළුක් ඒ පළාතේ බහුල වශයෙන් තිබෙන නිසායි. ඒකත් ලංකාවේ හොඳම සංස්ථාවක් හැටියට පිළිගන්න පුළුවනි. මේ දෙකෙන්ම අද විශාල ලාභ ලැබෙනවා.

**ගරු ද සොයිසා සිරිවර්ධන**
*(கௌரவ டி சொய்சா சிறிவர்தன)*
(The Hon. de Zoysa Siriwardena)

අද.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

අද, ඊයේ, පෙරෙයිදා. හලාවත හිටපු මන්ත්‍රී කොරෙයා මහතා පටන්ගත් ඇසිඩ් කර්මාන්තය ගැනත් මේ අවස්ථාවේදී කරුණු කියන්නට යෙදුණා. එය අප වාල් භාවයේ සිටි රාජ්‍ය මන්ත්‍රණ සභා කාලයේ පටන්ගත් කර්මාන්තයක්. ඒ කාලයේ එන්. එම්. පෙරේරා මහතාත් පිලිප් ගුණවර්ධන මහතාත් යන දෙදෙනාම කර්මාන්ත කාරක සභාවේ සිටියා. අපට එදා අත දිගහැර වැඩ කරන්නට ඉඩක් ලැබුණේ නෑ. යන්ත්‍ර ගෙන්වන්න බලය දුන්නේ නෑ, බැංකුවලින් මුදල් ගන්න බලය දුන්නේ නෑ. එම නිසා කොරෙයා මහතාට හුඟක් බාධා ඇති වුණා. ඒ කාලයේ කඩදාසි කර්මාන්තයත් ඇසිඩ් කර්මාන්තයත් පටන්ගන්නා ලද්දේ හස්ත කර්මාන්ත වශයෙනුයි. කොරෙයා මහතාගේ කොට්ඨාශයටද සේවයක් වශයෙන් එහි ඇසිටික් ඇසිඩ් කර්මාන්තය පටන්ගත්තේ ඒ ප්‍රදේශයේ පොල්කටු හුඟක් තිබෙන නිසායි. මේ රටේ ලොකු කර්මාන්තශාලා පටන්ගැනුණේ නිදහස ලැබුණාට පසුවයි. සිමෙන්ති කර්මාන්තයත් කඩදාසි කර්මාන්තයත් අද ඉතා හොඳ තත්ත්වයකට පත්ව තිබෙනවා. කවුරු පටන්ගත්තත් ඒවායේ අද තත්ත්වය හොඳයි.

සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ වාර්තාව දැන් අවුරුදු 5 ක් ප්‍රමාද වී තිබෙනවා. එය බරපතල වරදක්. මා හිතන හැටියට මේ ඇමතිවරුන් මෙවැනි සංයුක්ත මණ්ඩලවල නිලධාරීන්ගේ බෙල්ලෙන් අල්ලා හොල්ලන්න ඕනෑ.

**ගරු ආර්. එස්. පෙරේරා (ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)**
*(கௌரவ ஆர். எஸ். பெரேரா—தகவல், ஒலிபரப்பு அமைச்சர்)*
(The Hon. R. S. Perera—Minister of Information and Broadcasting)

අවුරුදු පහක් තිස්සේ හෙල්ලුවේ නැත්තේ ඇයි ?

**ගරු ද සොයිසා සිරිවර්ධන**
*(கௌரவ டி சொய்சா சிறிவர்தன)*
(The Hon. de Zoysa Siriwardena)

ලංගමයේ වාර්තාව අවුරුද්දක් යන්න කලින් පිට කිරීමට අප කටයුතු යොදා තිබුණා.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

මා යටතේ තිබුණු සතොසේ වාර්ෂික වාර්තාව ඊළඟ අවුරුද්දේ හය මාසයක් යන්න කලින් ඉදිරිපත් කර තිබෙනවා. මහජන මුදල් ගැන ඇමතිවරුනුත් පාර්ලිමේන්තුවත් වගකිව යුතුයි. මෙය අප සියලුදෙනාටම, අපේ ආණ්ඩුවට පවා, ලජ්ජාවක්. වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කිරීම අවුරුදු පහක් ප්‍රමාද වෙනවා නම් ඒක අපේ ආණ්ඩුවටත් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවටත් ලජ්ජාවට කරුණක්. පෞද්ගලික ආයතනයක අධ්‍යක්ෂවරු මෙහෙම කළොත් වහාම ඒ අය ආයතනයෙන් ඉවත් කරනවා ඇති. එවැනි අධ්‍යක්ෂවරුන් තබා ගත්තොත් ආයතන බංකොලොත් වෙයි නොවැ.

**ගරු ද සොයිසා සිරිවර්ධන**
*(கௌரவ டி சொய்சா சிறிவர்தன)*
(The Hon. de Zoysa Siriwardena)

අපි ඇවිත් තවම මාස තුනයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

මා මේ තමුන්නාන්සේට දෙස් කියනවා නොවෙයි. කවුරුන් හෝ මේ තත්ත්වයට වගකිවයුතු කෙනෙකු සිටිනවා නම් ඔහුටයි මා දෙස් කියන්නෙ. වර්තමාන පාලනය යටතේ සම් භාණ්ඩ සංයුක්ත මණ්ඩලය දියුණු කිරීම අමාරු නම් මා උපදෙසක් දෙන්නට සතුටුයි. එක්සත් ජාතික පාක්ෂික යන් හම ගසනවායයි කී මන්ත්‍රීවරයෙක් මේ සභාවේ ඉන්නවා. ඔහු තමයි රත්න පුරේ මන්ත්‍රී නන්ද එල්ලාවල මහත්මයා. එතුමාව සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කරන්න.

**ගරු ආර්. එස්. පෙරේරා**
*(கௌரவ ஆர். எஸ். பெரேரா)*
(The Hon. R. S. Perera)

එතකොට කවුද හම ගහන්නෙ? ලීනස් සිල්වාද?

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

කවුරු වුනත් කමක් නැහැ. හම ගැසීම ගැන ඒ මන්ත්‍රීතුමාට හොඳ පුරුද්දක් තිබෙනවා. මා උපදෙසක් දෙන්නෙ. එතුමා මේ අවස්ථාවේදී සභා ගර්භයේ සිටිනවා දැයි මා දන්නේ නැහැ. නැත්නම් කරුණා කර එතුමාට කියන්න මා කී දෙය. එහෙම කරලවත් බලමු. වාර්ෂික වාර්තාවක් ඉදිරි පත් කිරීම අවුරුදු පහක් ප්‍රමාද කිරීම බොහොම වැරදියි. අපේ කාලයේ අඩුපාඩු කම් තිබුණා නම් ඒවා හරිගස්සාවිය කියා අප මේ ආණ්ඩුවෙන් බලාපොරොත්තු වෙනවා.

පූ. භා. 10.30

**එම්. ජී. මෙන්ඩිස් මයා.** (රත්ගම)
*(திரு. எம். ஜீ. மென்டிஸ்—ரத்கம)*
(Mr. M. G. Mendis—Ratgama)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂය ගිය වතාවේ බලයට පත් වූ අවුරුද්ද වෙනුවෙන්—1965 වර්ෂය වෙනු වෙන්—ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩ ලය ඉදිරිපත් කළ එකම වාර්ෂික වාර්තාව එම ආණ්ඩුව පරාජයට පත් වූවාට පසු අද අප අතට පමුණුවා තිබෙනවා.

ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ මට්ටක්කුලියේ කර්මාන්ත ශාලාව ගැන කල්පනා කරන විට අපට එකක් කියන් නට පුළුවනි. එනම් ලංකාවේ තිබෙන සංයුක්ත මණ්ඩල අතුරෙන්—කර්මාන්ත ශාලා අතුරෙන්—පළමුවැනි වරට ලාභයක් ලැබූ, පළමුවැනි වරට රටට විශාල ආදර්ශ රාශියක් දුන් කර්මාන්ත ශාලාව තමයි මට්ටක්කුලියේ සම් කර්මාන්ත ශාලාව. ඒ කර්මාන්ත ශාලාව පිළිබඳව වචනයක් දෙකක් කියන්නට මත්තෙන් විරුද්ධ පක්ෂයේ නායක තුමා ප්‍රකාශ කළ කරුණු එකකට දෙකකට පිළිතුරක් දියයුතුව තිබෙ නවා. මේ රටේ අද දියුණු වී තිබෙන කර් මාන්ත ආරම්භ කළේ එවකට තිබුණු එක් සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවෙන් යයි එතුමා කිව්වා. සිමෙන්ති කර්මාන්ත ශාලාව ගැනත් කඩදාසි කර්මාන්ත ශාලාව ගැනත් විරුද්ධ පක්ෂයේ නායකතුමා මතක් කළා. මට මතක හැටියට නම් මේ කර්මාන්ත ආරම්භ වුණේ යූ. එන්. පී. එක මේ රටේ ඇතිවීමටත් කලින්. 1944, 1945, 1946 කාල යේදී එවකට කම්කරු හා කර්මාන්ත ඇමති හැටියට කටයුතු කළ නැසී ගිය ජී. සී. එස්. කොරයා මහත්මයා මේ රටේ කර්මාන්ත සංවර්ධනයක් ඇති කිරීමට විශාල උත්සාහයක් ගත් බව මට මතකයි.

රාජ්‍ය මන්ත්‍රණ සභාවේ එවකට සිටි ප්‍රගතිශීලී මන්ත්‍රීවරුන් විසින් කරන ලද උද්ඝෝෂණය නිසා ජී. සී. එස්. කොරයා මහත්මයා මේ රටේ යම් යම් කර්මාන්ත ඇති කිරීමේ මුල් පියවර ගත්තා. මේ රටේ රෙදි කර්මාන්තය ආරම්භ කිරීමට අපට යන්ත්‍ර කීපයක් එවන්නය කියා එන්ග ලන්ත ආණ්ඩුවෙන් කළ ඉල්ලීමක් ගැන මට මතකයි. නමුත් එන්ගලන්ත ආණ්ඩුව ඒ අවස්ථාවේදී දුන් පිළිතුර කුමක්ද? ලංකාවට ඕනෑ තරම් රෙදි සපයන්නට එන් ගලන්තයට පුළුවනි, ලංකාව වැනි කෘෂි කාර්මික රටක කර්මාන්ත ආරම්භ කිරී මෙන් වැඩක් නැත යන පිළිතුර තමයි එන්ගලන්ත ආණ්ඩුවෙන් ලැබුණේ.

ඒ කාලයේදී බලයට පත් වී සිටි අපේ ජාතියේ පියාය කියා නම් කර ගෙන සිටින ඩී. එස්. සේනානායක මහත්මයා, සර් ඩී. බී. ජයතිලක යන මහත්වරුන් ඒ ප්‍රතිපත්තියට විරුද්ධව සටන් කර මේ රටේ කර්මාන්ත සංවර්ධනයක් ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිරීමට කිසිම උත්සාහයක් ගත්තේ නැහැ. ඒ කාලයේ මේ රටේ ප්‍රගතිශීලීන් විසින් කර ගෙන යන ලද එම ව්‍යාපාරයට පොඩ්ඩක්වත් ඇහුම්කන් දීමට කල්පනා කළේ නැහැ. ජී. සී. එස්. කොරයා මහත්මයා ගැන අපි කවුරුත් හොඳට දන්නවා. මා පුද්ගලිකව එතුමා ගැන දන්නවා. එතුමා කම්කරු ඇමතිවරයෙක් හැටියටත් යම්කිසි සේවයක් කළ කෙනෙක් බව අද වුණත් මට මේ ගරු සභාවේදී කියන්න පුළුවනි. කම්කරුවන්ට නියම තැන දීමටත්, ඒ වගේම මේ රටේ කර්මාන්ත සංවර්ධනයක් ඇති කිරීම සඳහාත් ඇමතිවරයෙක් වශයෙන් එතුමා විශාල උත්සාහයක් ගත්තා. නමුත් ඒ කාලයේ සිටි අපේ නායකයන්—ඩී. එස්. සේනානායක මහත්මයා, සර් ඩී. බී. ජයතිලක මහත්මයා වැනි උදවිය—කල්පනා කළේ අර ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන් කල්පනා කළ ආකාරයටමයි. මේ රට කෘෂිකාර්මික රටක්ය, මේ රටේ කවදාවත් කර්මාන්ත සංවර්ධනයක් ඇති කරන්න පුළුවන්කමක් නැත, කියන ප්‍රතිපත්තිය තමයි ඒ අය පිළිගෙන තිබුණේ. ඒ නිසා තමයි ඇත්ත වශයෙන්ම මේ රටේ කර්මාන්ත සංවර්ධනයක් ඇති කිරීමට මේ තරම් ප්‍රමාද වුණේ. ඒ නිසා විරුද්ධ පක්ෂයේ නායකතුමාට මොන විධියකින්වත් කියන්න පුළුවන් කමක් නැහැ, එතුමන්ලාගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් මේ රටේ කර්මාන්ත සංවර්ධනයට මොන විධියේ සේවයක්වත් කළාය කියා.

සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය ගැන කල්පනා කර බලන විට අප දන්නවා, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තිබුණ කාලයේ සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය කොයි වේලේ කඩා වැටෙයිදෝ කියන තත්ත්වයක තිබුණ බව. එය වසා දමන්න ඔන්න මෙන්න කියන තත්ත්වයකයි තිබුණේ. වාසනාවකට මෙන් 1956 දී එක්සත් ජාතික පක්ෂය පරාජය වී දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා ආණ්ඩුවක් පිහිටුවූවායින් පසුව තමයි, සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය—මට්ටක්කුලියේ කර්මාන්ත ශාලාව—විශාල වශයෙන් දියුණු වෙන්න පටන් ගත්තෙ. පළමුවැනි පියවරක් වශයෙන් 1956 න් පසුව, කම්කරුවන්ගේ සහයෝගය ලබාගෙන කම්කරුවන්ට නියම තැන දී කටයුතු කිරීමට පටන් ගත්තා. ඒ අන්දමට එම කර්මාන්ත ශාලාව දියුණු කිරීමට කටයුතු කළේ 1956 න් පසුව බව මා මතක් කර දෙන්න ඕනෑ. එදා සිටම එම කර්මාන්ත ශාලාව දියුණු වුණා. ඒ කර්මාන්ත ශාලාවේ සිටි කම්කරුවන්ට සෑහෙන තැනක් ලැබුණා. කුලීකරුවන් වශයෙන් සිටි අයට පෝර්මන්වරුන්ගේ තනතුර දක්වා උසස් වීමට අවස්ථාව ලැබුණා. ඒ විධියට 1956 න් පසුව කම්කරුවන්ට සෑහෙන තැනක් ලබා දුන්නා පමණක් නොවෙයි; ඊට පසුව කර්මාන්ත ශාලාවෙන් ලාභ ලබන්න පටන් ගත්තා. ලාභ ලබන්න පටන් ගත් පළමුවැනි කර්මාන්ත ශාලාව තමයි මට්ටක්කුලියේ සම්භාණ්ඩ කර්මාන්ත ශාලාව. කර්මාන්ත ශාලාවේ විශාල දියුණුවක් ඇති වෙමින් පිටරටවලට පවා සපත්තු ආදී භාණ්ඩ යවන්න පුළුවන් වුණා. එය ආදර්ශමත් කර්මාන්ත ශාලාවක් වුණා. අපත් අපේ කම්කරු සමිති ව්‍යාපාරයෙන් යම් යම් කර්මාන්ත ශාලා පටන් ගන්න විට ආදර්ශයක් හැටියට පෙන්නුම් කරන්නේ මෙම කර්මාන්ත ශාලාවයි. ඇත්ත වශයෙන්ම අපට ඒ කර්මාන්ත ශාලාව අමතක කරන්න බැහැ.

ඒ කාලයේදී එම සංයුක්ත මණ්ඩලයට ඉතාමත් හොඳ අධ්‍යක්ෂවරයෙක්ද පත් කර සිටියා. රොබින් රත්නම් කියන ඒ මහත්මයා අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලද්දේ 1956 න් පසුවයි. සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ අධ්‍යක්ෂ වශයෙන් සිටි ඒ මහතා තුනී ලෑලි කර්මාන්ත ශාලාවේ සභාපති වශයෙන්ද පත් කර සිටියා. එතුමාගේ කාලයේදී ඒ කර්මාන්ත ශාලා දෙකේම සිටි කම්කරුවන්ගේ සහයෝගය සියයට සියයක්ම ලබාගෙන කර්මාන්ත ශාලා දෙකේම දියුණුවට කටයුතු කර තිබෙනවා. අදත් කම්කරුවන් ඒ මහතාගේ නම සිහි කරනවා. එතුමා හොඳ ආදර්ශමත් අධ්‍යක්ෂවරයෙක් හැටියට, සභාපතිවරයෙක් හැටියට අදත් කම්කරුවන් සිහි කරනවා. තුනී ලෑලි කර්මාන්ත ශාලාවත්, ඒවාගේම සම් භාණ්ඩ සංයුක්ත මණ්ඩලයත්, යන දෙකෙන්ම අද ලාභ ලබන්නා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. ජී. මෙන්ඩිස් මයා.]

පුළුවන් තත්ත්වයක් ඇති වී තිබෙනවා. මේ විධියට ලාභ ලබන්නට පුළුවන් වුණේ මේ සංයුක්ත මණ්ඩල දෙකේ සභාපතිවරයා කම්කරුවන්ගේ වෘත්තීය සමිතිවල සහ යෝගය ලබාගෙන කටයුතු කළ නිසා බව මේ අවස්ථාවේදී කියන්නට කැමතියි. එසේ වුවද, එක්සත් ජාතික පක්ෂය බලයට පත් වීමෙන් පසුව ඒ තරම් හොඳට කටයුතු කළ ඒ සභාපතිවරයා ඉවත් කළා. ඒ පක්ෂයේ හෙන්චයියලා අධ්‍යක්ෂ තනතුරුවලට පත් කළා. මේ සංයුක්ත මණ්ඩල දෙක නැවතත් පරිහාණි තත්ත්වයට වැටෙන්නට පටන් ගත්තේ අන්න එදා සිට තමයි.

ඇත්ත වශයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ පස් අවුරුදු පාලන කාලය තුළදී මේ රටේ කර්මාන්ත ශාලාවල තිබුණු දියුණුව සම්පූර්ණයෙන්ම නැති කර දමන්නට යෙදුණා. යම් යම් සංයුක්ත මණ්ඩලවලට නමට පමණක් අධ්‍යක්ෂ වරුන් පත් කර ගත්තා. හිටපු කර්මාන්ත ඇමතිතුමාගේ චග්ගෝලයකු සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කර ගත්තා. එහෙත් පසු ගිය මැයි 27 වැනිදා ආණ්ඩුව වෙනස් වෙනවාත් සමගම කම්කරුවන් ඔහුට පයින් ගසා දොට්ට දැම්මා. අද ඔහු කර්මාන්ත ශාලාවේවත් නැහැ. ඔහු හිටපු ඇමතිවර යාගේ චග්ගෝලයා වී කටයුතු කරන්නට පටන් ගත්තා. ආණ්ඩුව වෙනස් වෙනවාත් සමගම කම්කරුවන් ඔහුට පයින් ගසා දොට්ට දැමීම නිසා අද ඔහුට කර්මාන්ත ශාලාවේවත් රක්ෂාවක් නැහැ. එක්සත් ජාතික පක්ෂය සංයුක්ත මණ්ඩල පාලනය කෙළේ මේ විධියටයි. ඉතාමත්ම හොඳින් වර්ධනය වෙමින් ආ සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය අද පරිහාණි තත්ත්වයට වැටී තිබුණත් වර්තමාන කර්මාන්ත ඇමතිතුමා යටතේ පාලනය වන ආයතනයක් හැටියට නැවතත් එය දියුණු තත්ත්වයකට එනවා ඇතැයි මා විශ්වාස කරනවා. ඒ සංයුක්ත මණ්ඩලය නැවතත් දියුණු තත්ත්වයකට පත් කරන්නට වර්තමාන කර්මාන්ත ඇමතිතුමාට පුළුවන්කම තිබෙනවා යයි මා විශ්වාස කරනවා. ඒ වාගේම ඒ සංයුක්ත මණ්ඩලය මේ රටේ අනෙක් සංස්ථාවලට ආදර්ශයක් වෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. වෘත්තීය සමිතිවලත් කම්කරුවන් ගේත් විශ්වාසය දිනාගෙන වැඩ කරන්නට පටන් ගත්තොත් ලංකාවේ තිබෙන සියලුම කර්මාන්ත ශාලාවලින් සහ සංයුක්ත මණ්ඩලවලින් විශාල දියුණුවක් ඇති කර ගන්නට පුළුවන් වෙනවා ඇතැයි මා කල්පනා කරනවා. කම්කරුවන්ගේ සහයෝගය ලබා නිෂ්පාදනය දියුණු නො කර කවදාවත් අපේ රට දැනට වැටී තිබෙන තත්ත්වයෙන් ගොඩ ගන්නට බැහැ. අවශ්‍ය සහයෝගය මේ රජයට දෙන්නට කම්කරුවන් ලෑස්තියි. මේක මහජන යාගේ රජයක් නිසා, කම්කරු ජනතාව විසින් පත් කරනු ලැබූ රජයක් නිසා මේ රජයට තමන්ගේ සම්පූර්ණ සහයෝගය දීමට කම්කරුවන් සූදානම් බව අද සියලු දෙනාම පිළිගන්නා දෙයක්. ඒ නිසා කම්කරුවන්ට තැන දී, කම්කරුවන්ගේ ප්‍රශ්න ගැන සැලකිල්ලෙන් සොයා බලා, වෘත්තීය සමිතිවල සම්පූර්ණ සහයෝගය ලබා ගෙන කටයුතු කරගෙන යන්නට ලෑස්ති විය යුතුයි. එසේ කළහොත් එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව විසින් පරිහාණියට පත් කළ මේ රටේ කර්මාන්ත ශාලා සහ සංයුක්ත මණ්ඩල නැවත වරක් දියුණු කරගෙන මේ රට කර්මාන්තමය කිරීමට පුළුවන් බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

පූ. භා. 10.41

ආනන්ද සිරිසේන මයා. (රඹුක්කන)
(திரு. ஆனந்த சிறிசேன—றம்புக்கனை)
(Mr. Ananda Sirisena—Rambukkana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ 1965 මාර්තු 31 වැනිදායින් අවසන් වන වර්ෂයේ වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නේ 1968 ජූලි මාසයේ 25 වැනිදායි. ඇත්තෙන්ම මෙම ගණන් වාර්තාව අප ඉදිරියේ තැබීමට අවුරුදු තුනකටත් වැඩි කාලයක් ගත කර තිබෙනවා. මේ සංයුක්ත මණ්ඩලයේ මූල ධනය සෑදී තිබෙන්නේ මෙහෙමයි: 1957 දී රුපියල් 17,00,000 ක් මේ සඳහා යොදා තිබෙනවා. ඊට පසුව 1962 වර්ෂයේ දී රුපියල් 35,00,000 ක් දී තිබෙනවා. 1969 වර්ෂයේදී රුපියල් 44,12,000 ක් දී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනවා. ඒ අනුව රුපියල් 96,12,000 ක මූල ධනයක් ඇතිවයි, මේ සංයුක්ත මණ්ඩලය වැඩ පටන් ගෙන තිබෙන්නේ. 1965 මාර්තු මාසෙ 31 වෙනිදායින් අවසන් වන වර්ෂයේ වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නේ 1968 ජූලි මාසෙ 25 වෙනිදායි. ගණන් හිලව් ආදී වාර්තාව ඉදිරිපත් කිරීමට අවුරුදු තුනක් කල් ගත වී තිබීමෙන් මහ ජනයාට හිතාගන්න පුළුවන් ඒ කර්මාන්ත ශාලාවේ වැඩ කටයුතු මොන විධියට ගෙන ගොස් තිබෙනවාද කියා.

1970 මැයි මාසයෙන් පසුවයි, නව රජය මෙම සංයුක්ත මණ්ඩලයේ වැඩ කටයුතු භාරගත්තෙ. පසුගිය කාල සීමාව ඇතුළත නිෂ්පාදනය කර අවසන් වී තිබෙන ඒ වර්ගයේ සපත්තු කුට්ටම් සංඛ්‍යාව 92,928 යි. බී වර්ගයේ සංඛ්‍යාව 6,425 යි. සී වර්ගයේ සංඛ්‍යාව 126 යි. 1970 වන විට මූලික ධනය වශයෙන් ලක්ෂ 100 ක් වෙන් කර තිබුණ අතර එම ආයතනය මගින් විකිණීම සඳහා සූදානම් කර තිබෙන නිෂ්පාදන සංඛ්‍යාවේ වටිනාකම රුපියල් 67 ලක්ෂයයි. එයින්ම පෙනී යනවා, මොන තරම් අදක්ෂ විධියට ඒ කාල සීමාව ඇතුළත කටයුතු කෙරී තිබෙනවාද කියා. වෙළඳ ව්‍යාපාරයක් වශයෙන් යම් කටයුත්තක් කරගෙන යන විට ගත යුතු මහන්සිය සහ උනන්දුව ගෙන නොතිබෙන බවත් එයින් පැහැදිලි වෙනවා.

තවත් කාරණයක් නම් ස්වකීය නිෂ්පාදන අලෙවි කිරීම සඳහා 1970 දක්වා ඇති අවුරුදු 13 තුළම මුළු දිවයිනේම ඒජන්සිස් නොහොත් වෙළඳ මධ්‍යස්ථාන වශයෙන් තිබුණේ ස්ථාන 4 ක් පමණයි. සීමා සහිත සිටි ස්ටෝර්ස් උතුරු මැද පළාත වෙනුවෙනුත්, බණ්ඩාරවෙල ෆැන්සි ස්ටෝර්ස් ඌව සබරගමු පළාත් වෙනුවෙනුත්, කලම්බු ඒජන්සිස් උතුරු මැද පළාත සහ වයඹ පළාත වෙනුවෙනුත්, සිල්වා—ගාල්ල දකුණ හා කළුතර දිස්ත්‍රික්කය වෙනුවෙනුත්, පත් කර තිබුණා. රුපියල් ලක්ෂ සියයක මූල ධනයක් වියදම් කර පිහිටුවා තිබෙන මෙම සංයුක්ත මණ්ඩලයේ නිෂ්පාදන මුළු ලංකාව පුරාම අලෙවි කිරීමට වෙළඳ මධ්‍යස්ථාන 4 කට ශක්තියක් තිබෙනවාද කියා තමුන්නාන්සේට වැටහෙනවා ඇති. එයින්ම පෙනී යනවා කිසිම වග විභාගයක් නැතිව, කිසිම තේරුමක් නැතිව, පසුගිය ආණ්ඩුවෙන් ඉතාම අදක්ෂ විධියට ඒ කටයුතු කරතිබෙන බව.

මෙම ගණන් හිලව් අනුව, නිම කරන ලද පාවහන්වල සහ හම්වල වටිනාකම රුපියල් 28 ලක්ෂයක් වන බවත්, අමු ද්‍රව්‍යවල වටිනාකම ලක්ෂ 25ක් පමණ වන බවත්, බාගෙට කෙරී තිබෙන නිෂ්පාදනවල වටිනාකම ලක්ෂ 6ක් පමණ වන බවත්, කර්මාන්ත ශාලාවේ උපකරණවල වටිනාකම ලක්ෂ 8ක් පමණ වන බවත් අපට පෙනී යනවා. ඒ ආකාරයට සංයුක්ත මණ්ඩලයේ මූලික ධනය ලක්ෂ 67කට සීමා වී තිබෙන නිසා එම කර්මාන්තශාලාව කරගෙන යෑමේදී ගෙන ගිය අදූරදර්ශී ක්‍රියා මාර්ගය තවදුරටත් ගෙන ගියා නම් අපේ ධනයෙන් බලාපොරොත්තු වන සාර්ථක ප්‍රතිඵල අපට කොයි තරම් දුරට ලැබෙන්න තිබුණාද කියා තමුන්නාන්සේට පෙනී යනවා ඇති.

අපට දැනගන්නට ලැබී තිබෙන පරිදි මේ කර්මාන්තශාලාවේ කටයුතු මේ තරම් පරිහානි තත්ත්වයකට පත් වී තිබීමට හේතුව ගත වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නොයෙක් අවස්ථාවලදී කර තිබෙන වැරදියි. එක අතකින් සංස්ථාවේ පත් කිරීම් සහ උසස් කිරීම් වැරදි විධියට කර තිබෙනවා. සේවකයන් බඳවා ගැනීමේදීත්, ස්ථිර කිරීමේදීත් ඒවා අයුතු විධියට කර තිබෙන බව අප දන්නවා. රාජකාර්‍ය පිළිබඳ වෙනස් කිරීම් සහ මාරු කිරීම් හිතුවක්කාර විධියට කර තිබෙනවා. ඊටත් වඩා වැදගත් කරුණ නම් සංස්ථාවේ ප්‍රතිපත්තිවලට පටහැනිව කැබිනට් අනුමැතියක් නැතිව ලක්ෂ 40ක පමණ මුදලක් වියදම් කර තිබීමයි. ලක්ෂ සියයකට ඇස්තමේන්තු කර තිබෙන අතර කැබිනට් අනුමැතියක් නැතිව ලක්ෂ 40ක් වියදම් කිරීමට, ගත වූ ආණ්ඩුව විසින් මෙම මණ්ඩලයට ඉඩ දී තිබෙනවා. එම නිසා ඉතාමත් අපරීක්ෂාකාරී විධියට ඒ අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සිදු වී තිබෙන බව අපට කියන්න සිදු වී තිබෙනවා. එහෙම නම් අවුරුදු 3කට කලින් ගණන් වාර්තාවක් අනුව පෙනෙන පරිදි කැබිනට් අනුමැතියක් නැතිව කිසිම වැඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද සිරිසේන මයා.]

ගැම්මකට නැති අන්දමින් මේ සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය ලක්ෂ 40ක් පමණ මේ රටේ ධනය වියදම් කර මෙවැනි තත්ත්වයකට පත් වී තිබෙනවා නම් ඉන් එහාට අනිකුත් සංයුක්ත මණ්ඩල ගැන කථා කරන්නට වුවමනාවක් නැහැ. ඒවාත් මේ වගේම ඇතැයි කියා විශ්වාස කරන්නට අපට සිදු වී තිබෙනවා.

සත්වෝද්‍යානය සඳහා ඊයේ සම්මත වූ ගිනුම අනුව රුපියල් 2,85,750ක් වියදම් වශයෙන් පෙන්නුම් කර තිබුණා. එහි විෂය අංක 82 යටතේ සතුන් හුවමාරු කර ගැනීම සඳහා වියදම් වශයෙන් රුපියල් 32,500ක් සඳහන් කර තිබුණා. අපට සපයා තිබුණේ එහි 1962-63 වර්ෂයේ ගණන් වාර්තාවයි. මේ අනුව අපට පැහැදිලිවම පෙනී යනවා ඒ විධියට අවුරුදු ගණන් ගියාට පසුව වාර්තා ඉදිරිපත් කිරීම පසුගිය රජයේ සිරිතක් වශයෙන් තිබුණා කියා. ඒ නිසා මේ අලුත් රජයේ නව ඇමතිතුමා මෙම සංයුක්ත මණ්ඩල ගැන විශේෂ පරීක්ෂණයක් කර විශේෂ වැඩ පිළිවෙළක් සකස් කර මේ අපතේ යන මුදල් නැතහොත් ධනය නියම විධියට පරිහරණය කිරීමට කටයුතු නොයෙදුවොත් මේ සංස්ථාවලින් අපට සදාකාලිකවම පාඩු සිදු වී එයින් මේ රටේ මූලික ධනය විනාශ වී වෙනත් අත්‍යාවශ්‍ය සේවාවන් සඳහා මුදල් නැතිව ගොස් සෑම එකක්ම අඩපණ වන බව මා මතක් කරන්නට කැමතියි. ඒ නිසා මේ අවසථාවේදී ගරු ඇමතිතුමාට මා මතක් කරන්නේ මෙවැනි අවස්ථාවලදී ක්ෂණික තීරණ අරගෙන ක්ෂණිකව කටයුතු කිරීමෙන් මේ සංස්ථා හරියාකාර සකස් කර ගෙන රටේ ප්‍රයෝජනය සඳහා මේ ධනය යෙදවීමට කටයුතු කරන්නය කියන එකයි. එය තමුන්නාන්සේ ඉදිරියේ ප්‍රකාශ කරමින් මගේ වචන තුන හතර මෙයින් අවසාන කරනවා.

පූ. භා. 10.50

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)

*(திரு. எம். தென்னக்கோன்—நிக்கவரட்டிய)*

(Mr. M. Tennakoon—Nikaweratiya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ 1964-65 වර්ෂයේ වාර්තාවයි අපි දැන් සාකච්ඡා කරන්නේ. ගරු පාර්ලිමේන්තු ලේකම් තුමා මේ අවස්ථාවේ සභාවේ සිටීම ගැන මා සන්තෝෂ වෙනවා. මක්නිසාද කියතොත් එතුමාට මේ අවස්ථාවේ මෙවැනි වාර්තාවක් සාකච්ඡා කරන්නට අවස්ථාව ලැබීමෙන් එතුමාටත් එතුමාගේ ඇමතිතුමාටත් භාර වන කාර්යයන් පොදු මහ ජනයාගේ යහපත පිණිස ඉටු කිරීමට අවස්ථාව ලබා ගැනීමට මෙය හොඳ අවස්ථාවක් වන නිසයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ සංයුක්ත මණ්ඩල ඇති කරන්නට පටන් ගත්තේ යම් ප්‍රධාන හේතුවක් උඩයි. ඒ ප්‍රධාන හේතුව නම් අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ ඇති කර ගත් දෙපාර්තමේන්තු වල තිබුණු නොයෙකුත් නීතිරීති අනුව රටේ සංවර්ධනයට අවශ්‍ය වන විධියේ වේගවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට බැරි වන නොයෙකුත් අනවශ්‍ය කඩුළු තිබීමයි. එයට ඒ කාලයේ " රෙඩ් ටේප් " කියලයි කිව්වේ. ඒ රතු පටි කඩා දමා ඉදිරියට යැමක් බලාපොරොත්තුවයි මේ සංයුක්ත මණ්ඩල හා සංස්ථා ඇති කර ගැනීමේ අරමුණ ඇති කර ගත්තේ. හුඟක් කලින්ම පටන්ගත් එකක් තමයි ගල්ඔය සංවර්ධන මණ්ඩලය. එහෙත් අද තිබෙන මේ සංස්ථා හා සංයුක්ත මණ්ඩල ගැන කල්පනා කර බලන විට—මේ වාර්තා දෙස බලන විට—අපට පෙනී යන කරුණක් තමයි ඒ මගින් මහජනතාවත් පාලකයිනුත් බලාපොරොත්තු වූ ඉලක්කය කරා යාමට නොහැකි වී තිබෙන බව. බලාපොරොත්තු වුණේ හැකි තරම් අඩුවෙන් වියදම් කර හැකි තරම් පිරිමැසීම් කර හැකි තරම් වේගයෙන් සංවර්ධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ සංයුක්ත මණ්ඩල ඇති කිරීමේ මූලික පරමාර්ථය එයයි. එහෙත් අද ඒ පරමාර්ථය වෙනස් වෙලයි තිබෙන්නෙ. සමහරවිට දේශපාලන පක්ෂවලට නොයෙක් විධියේ ආධාර උපකාර කළ ඇත්තන්ට ණය ගෙවන්නටත් සංයුක්ත මණ්ඩල පිහිටුවනවා. ඒ නිසා ඇතැම් සංයුක්ත මණ්ඩල ණය ගෙවීමේ මණ්ඩල බවට පත්වෙලා තිබෙනවා. තම තමන්ගේ නොයෙක් පහසුකම් සලසා ගැනීමටත් සංයුක්ත මණ්ඩල පාවිච්චි කරනවා. විශේෂයෙන් ගමනාගමන පහසුව සඳහා සංස්ථා වාහන යොදා ගන්නවා. පඩිනඩි ගැන කල්පනා කර බලමු. සංයුක්ත මණ්ඩලවල එක් පඩි ක්‍රමයකුත්, දෙපාර්තමේන්තුවල තවත් පඩි ක්‍රමයකුත් තිබෙනවා. සංයුක්ත මණ්ඩලවල නිලධාරීන් තෝරා ගැනීමේදී රජයේ සේවාවල දීර්ඝ කාලයක් සේවය කොට දක්ෂතා ලැබූ විශේෂ පළපුරුදුකම් තිබෙන උදවිය නොවෙයි, සංයුක්ත මණ්ඩලවලට ඇතුළත් වෙන්නෙ. අත්තනෝමතිකව හිතු මනාපයට සංයුක්ත මණ්ඩලවලට නිලධාරීන් තෝරා ගන්නා නිසා ඒවායින් ලැබිය හැකි ප්‍රයෝජන ඒ අයුරින් ලැබෙන්නෙ නැහැ. එපමණක් නොව අද සංයුක්ත මණ්ඩලවල සේවය කරන බොහෝ දෙනෙකු ලබන්නා වූ වරප්‍රසාද ලබන්නට රජයේ සේවයේ යෙදී සිටින නොයෙක් විධියේ දක්ෂතා ඇති උදවියට අවස්ථාවක් ලැබෙන්නෙත් නැහැ.

කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශ යටතේ පමණක් සංයුක්ත මණ්ඩල 22ක් තිබෙනවා. දැනට මේ සභාවේ සිටින ඒ අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු ලේකම්තුමා බොහෝ දුරට මේ අදහස් දරන, මේවා අනුමත කරන, යමක් කරන්නට ඕනෑ කියන යම් වේගයක් යම් උනන්දුවක් ඇති කෙනෙකු බව මගේ විශ්වාසයයි. අප මේ කරුණු දක්වන්නේ අද පවතින අසතුටුදායක තත්ත්වය යහපත් කර ගැනීම සඳහායි. වරද පෙරලා "මේ මේ ඇත්තන්ගේ වරද තිබුණා; ඒකට අප මොනවා කරන්නද ?" කියා අපට අද මහජනයාගෙන් බේරෙන්නට පුළුවන්කමක් නැහැ. එම නිසා තිබෙන අඩුපාඩුකම් මගහරවා ගැනීමට ගතයුතු ප්‍රධාන පියවර කිහිපයක් අප විසින් ඉක්මණින්ම ගත යුතුව තිබෙනවා.

වාසනාවකට වගේ මේ සෑම සංයුක්ත මණ්ඩල නීතියකම වගේ විධිවිධාන යොදා තිබෙනවා, පෞද්ගලික අංශයේ ගණකාධිකාරී ආයතනයක් මගින් පරීක්ෂා කරන ලද ගිණුම් වාර්තා මේ ගරු සභාවට ඉදිරිපත් කළ යුතුයි කියා. දැන් මේ වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නේ, වරලත් ගණකාධිකාරී සමාගමක් වන ෆියුඩර් වී. පෙරේරා සහ සමාගමයි. මේ අන්දමට පෞද්ගලික අංශයේ ගණකාධිකාරී සමාගමක් ගණන් හිලව් පරීක්ෂා කරන විට, වෙනත් ආයතනයක් මගින් කෙරුණා නම් එළි විය නොහැකි කරුණු රාශියක් එළියට එනවා. වාසනාවකට වගේ අපට මේ විධියේ වාර්තා නිසා මේ ස්ථානයේදී කරුණු හුඟක් මතු කරන්නට අවස්ථාව ලැබෙනවා. මේ වාර්තා තිබෙන නිසා එතරම් දීර්ඝ වශයෙන් මේවා ගැන කථා කිරීම අවශ්‍ය යයි මා හිතන්නෙ නැහැ. එහෙත් මෙවැනි වාර්තාවල එන ප්‍රධාන කරුණු උපුටාගෙන ඒවා ගැන අප ටිකක්වත් සාකච්ඡා කරන්නේ සංයුක්ත මණ්ඩලවල තත්ත්වය වඩා යහපත් අතට හරවා ගැනීමේ අදහසිනුයි.

මම මේ වාර්තාවෙන් කරුණු දෙකතුනක් ගැන පමණක් අදහස් කීපයක් පළ කරනවා. මේ වාර්තාවේ 7 වෙනි පිටුවේ මෙහෙම තිබෙනවා :

**"අ—අභ්‍යන්තර පාලනය :**

ක්‍රියාවේ යොදවා තිබූ අභ්‍යන්තර පාලන ක්‍රමය හේතුකොට ගෙන, සමාලෝචනය කිරීමේදී අපට පහත දැක්වෙන අසම්පූර්ණත්වයන් පෙනිනි.

**(අ) භාණ්ඩ ඇණවුම් කිරීම—**

මිල ගණන් පොතෙහි සඳහන්ව නොතිබුණු නම්, අනුමැතිය සඳහා සකස් කර තිබූ මිල ගණන් උපලේඛනවලට ඇතුලත්ව තිබෙන අප බොහෝ අවස්ථාවලදී දුටුවෙමු.

**(ආ) වේතන**

1. පාවහන් කම්හල—වැටුප් ගෙවීම සඳහා ගන්නා ලද චෙක්පත් ගෙවිය යුතු නියමිත මුදලට නොව සම්පූර්ණ ගණන්වලින් තිබුණි. වැටුප් ගෙවීමෙන් පසුව ඉතිරි වන්නාවූ ශේෂ මුදල් ආපනශාලාවේ කූපන් පොත්වල මුදල් ගෙවීමටද, සංයුක්ත මණ්ඩලයෙන් ගෙවිය යුතුව ඇති කම්කරු දායක මුදල් සහ ගෙවිය යුතු කපා හැරීම් සඳහාද යොදවා තිබුණි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

මෙම ගෙවීම් කරනු ලැබීමෙන් පසුව බැංකුවට දැමීමට මත්තෙන් මුදල් පාලක ළඟ ඉතිරි මුදල් සති දෙකක පමණ කාලයක් තබා ගෙන ඇත."

රජයේ සංයුක්ත මණ්ඩලයක මුදල් පරිහරණය කෙරිය යුත්තේ මෙහෙමද ?

"2. හිමිකම් නොපෑ වැටුප්—හිමිකම් නොපෑ වැටුප්ද මුදල් පාලක විසින් සති දෙකක් පමණ හෝ ඊටත් වැඩි කාලයක් හෝ ළඟ තබාගෙන ඇත්තේ එම වැටුප්, ඒවා අයිති සේවකයන් විසින් ඉල්ලනු ලබන බලාපොරොත්තුවෙනි."

මේවා සඳහන් නොකරනවා නම් මේ වාර්තා සාකච්ඡා කරනවාය කීමේ තේරුම මොකක්ද ? මේ වාර්තා නොකියවා නිකම්ම අනුමත කිරීමෙන් වන්නේ ඉදිරියේදීත් මෙවැනි වැරදි දිගින් දිගටම සිදු වීමයි. එම නිසා, මෙවැනි අඩුපාඩු ගැන මේ ගරු සභාවේදී සඳහන් නොකරනවා නම් වෙන කොහේදී සඳහන් කරන්නද ? ඊළඟට, 8 වැනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා :

"(ඇ) තොග

(i) අමු ද්‍රව්‍ය, නිම කළ හම් සහ පාවහන්—

1. තොග ලැජරය සහ බින් කාඩ් ශේෂයන් වාරිකාව සසඳා ඇති අතර මාස අවසානයේ තොග සැසඳුම් ප්‍රකාශනය හා සැසඳුවත්, එම සැසඳීම පිරිවැය ලැජරයේ ඇති තොග පාලන ගිණුම හා සසඳා නැත."

මෙම සංයුක්ත මණ්ඩලයේ ගණකාධිකාරිවරයෙක් නැද්ද ?

2. ගබඩා භාරකරු සහ ගණක ලිපිකරු යන දෙදෙනාට, අවයව කොටස් සහ ග්‍රයින්ඩර් ගබඩා කාමරයේ ඉඩකඩ සලසා ඇත.

(ii) අමතර කොටස්—

මෙම ගබඩාවේ පවතින පාලන ක්‍රමය තවමත් නොසැහේ. යට දැක්වෙන අඩුපාඩු අප විසින් දක්නා ලදී.

1. බින් කාඩ් ශේෂයන්, තොග ලැජරය හා සන්සන්දනය කර බැලීමට මාසය අවසානයේ තොග සැසඳීම් කර නොතිබුණි. පිරිවැය ලැජරයේ අමතර කොටස් තොග පාලන ගිණුම හා සමඟ බින් කාඩ් ශේෂයන් සැසඳීම, සමීක්ෂණ මණ්ඩලය විසින් හරි වැරදි බැලීමට මත්තෙන් හෝ සැසඳීමට උත්සාහයක් ගෙන නොතිබුණි.

2. අමතර කොටස් නිකුත් කිරීම (විදුලිය කටයුතු ද්‍රව්‍ය හැරුණු විට) බඩු ඉල්ලුම් පත් අනුව නොකැරුණි. ඒ වෙනුවට ලැබීම් සනිටුහන් කිරීමක් වශයෙන්, නිකුත් කිරීමේ රෙජිස්ටරයක කෙටිසන යොදන ලෙස අමතර කොටස් ලබාගත් දෙපාර්තමේන්තු හෝ කාර්මිකයකුට නියම කෙරුණි.

3. බින් කාඩ්වල, තොග නැවත ඇණවුම් කිරීමේ සීමාවන් සහ අවමය සහ උපරිමය සඳහා වෙන් වූ තීරුවල සටහන් ඇතුළත් කර නොතිබුණි."

මේ සංයුක්ත මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී අපට තනිකරම කියන්නට සිදු වී තිබෙන්නේ සංයුක්ත මණ්ඩලයෙන් කෙරුණු දේවල් ගැන නොවෙයි නොකෙරුණු දේවල් ගැනයි. අපේ අනෙකුත් සංයුක්ත මණ්ඩලවලට වඩා මේ සංයුක්ත මණ්ඩලය තරමක් හොඳ එකක්ය යි මා හිතුවා. තරමක් හෝ හොඳය යි හිතූ මේ සංයුක්ත මණ්ඩලයේ කටයුතු කෙරෙන්නෙත් මේ තරම් නරක විධියට නම් අනෙක්වා ගැන කියනුම කවරේද ?

"(iii) සාමාන්‍ය—

1. මෙම වර්ෂයේදීද අන්තර් තොග පරීක්ෂණය කර නැති බව පෙණුනි."

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜெ. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

අනෙක් ඔක්කොමත් ජනසතු කරන එකයි තියෙන්නෙ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

මොකද ජනසතු කිරීම ගැන එහෙම කියන්නේ ? ලෙඩේ කොහේද ? මොකක්ද වෙදකම ? ලෙඩේ වෙන එකක්. දෙන්නේ වෙන බෙහෙතක්. අර අපේ ගම්වල පවතින කථාවක් වාගේ ලෙඩා මැරුණත්, බඩ හොඳට විරේක වුණා නේද කියලා අපට සන්තෝෂ වෙන්නට පුළුවන්ද ? ඒකයි අපට අහන්නට තියෙන්නේ. මේ කාරණය බොහොම වැදගත් දෙයක් හැටියට සලකන්නට ඕනෑ. ආණ්ඩුවක් වෙනස් වෙලා අලුත් ආණ්ඩුවක් මහජනයාගේ විශාල විශ්වාසයක් සහ බලාපොරොත්තු ඇතිව දැන් පිහිටවාගෙන තිබෙනවා. ඒ නිසා මේවා කලින් කරගෙන ගිය වැරදි විධියටම කරගෙන යෑම උචිත නැහැ. මහජනයාට අපි පිළිතුරු දෙන්නට ඕනෑ. මහජන නියෝජිතයන් වන අපෙන් මහජනයා ප්‍රශ්න අහනවා. ඒවාට සතුටුදායක පිළිතුරුත් ඒ උ විය අපෙන් බලාපොරොත්තු වෙනවා. නොයෙක් විධියේ බලපෑම් එමට තිබුණා. ඒක ඇත්ත. දැන් ඒ සියල්ලක්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මැඩ පවත්වා නියම විධියට වැඩ කරන්නට එඩිතරව සූදානම් විය යුතුයි. මේ මහ ජන ආණ්ඩුව ඇති කෙළේ, සමගි පෙරමුණ බලයට පත් කෙළේ, මේ සියල්ලක්ම ඉටු කිරීමට ඉඩ සිදු කරගෙන වැඩ කටයුතු සාර්ථක අන්ද මට කරගෙන යනවා දකින්නටයි. ඒ නිසා මේවා එකින් එක වෙන් වෙන් වශයෙන් උපුටාගෙන ඉදිරිපත් කරනවා විනා දෝෂදර්ශනයකට භාජන කිරීමට නොවෙයි අප බලාපොරොත්තු වන්නේ. කිසිම කෙනෙකු කෙරෙහි ද්වේෂයකින් හෝ වෛරයකින් මේවා ඉදිරිපත් කරනවා නොවෙයි. අපි මේවා මේ ආකාරයට සඳහන් කරන්නේ මහජනයා කෙරෙහි අප තුළ තිබෙන අනුකම්පාව නිසා බව කියන්නට කැමතියි.

මේ වාර්තාවේ 9 වන පිටුවෙන් මම නැවතත් උපුටා දක්වන්නම් :

"මෙම වර්ෂයේදීද අන්තර් තොග පරීක්ෂණය කර නැති බව පෙනුණි."

මෙයින් අදහස් කරන්නේ මීට පෙර වර්ෂවලදීත් අන්තර් තොග පරීක්ෂණය කර නැති බවයි. සුරුට්ටු කඩයක පවා තොග ගණන් ගැනීමක් වරින් වර කෙරෙන බව තමුන්නාන්සේ දන්නවා. ගමක පුංචි සුරුට්ටු කඩයක පවා තොග ගණන් ගැනීමක් වරින් වර කෙරෙන බව තමුන්නාන්සේ දන්නවා. ගමක පුංචි සුරුට්ටු කඩයක් තිබෙනවා නම් එහි වුවත් නියම පාලනයක් ඇති වන්නට කරන දෙයක් තමයි වරින්වර එහි තිබෙන තොග ගැන සෝදිසි කිරීම. ඒවා නරක් වෙලා තිබෙනවාද, එසේ නම් කොයි තරම් ප්‍රමාණයක් නරක් වෙලා තිබෙනවාද, යනාදි වශයෙන් සොයා බලන්නට ඕනෑ බව ගමක ඉන්න පුංචි සුරුට්ටු කඩකාරයා පවා දන්නවා. රජයේ සංස්ථාවකින් එවැන්නක්වත් කෙරෙන්නේ නැහැ.

විරුද්ධ පාර්ශ්වයේ ගරු නායකතුමා එතුමාගේ කාලයේදී සංයුක්ත මණ්ඩල ගැන කථා කළ අවසථාවක ඒවායේ අඩුපාඩු ගැන සඳහන් කරමින් කියා සිටියේ සංස්ථාවල දොස් නැති කරන්නට ක්‍රියා කරන බවයි. ගණන් හිලවු භාරව ලිපිකරුවන් පමණක් සිටීම අසතුටුදායක නිසා ඒ වෙනුවට ගණකාධිකාරීන් පත් කරන බවත් එදා එතුමා කිව්වා. එහෙත් ඒවා ඒ ආකාරයටම සිදු වෙලා තිබෙනවාද? නැහැ. 1964-65 වර්ෂයේ වාර්තාවයි දැන් අපි සලකා බලන්නේ.

"අයවැය ලේඛනය පාලනය :"

ඒකත් ඒ විධියටයි තිබෙන්නේ.

"කර්මාන්ත ප්‍රදර්ශනය :

මෙන්න බලන්න, කර්මාන්ත ප්‍රදර්ශනය ගැන කියා තිබෙන දේ. ඒකත් තියෙන්නේ 9 වැනි පිටුවේ.

"ප්‍රදර්ශනයේදී බඩු නිකුත් කිරීම් හා සවි කිරීම් සම්බන්ධ විධිමත් ලේඛන නොතිබුණෙන් මෙම බඩු නැතිවීමත් මෙම මුදල් ප්‍රමාණයේ නිවැරදිතාව යත් සහතික කිරීමට නොහැකිය."

අපේ ගමකට ඩිස්පෙන්සරියක් ඉල්ලුවත්, වින්නඹුමාතාවක් ඉල්ලුවත් මුලින්ම කියන්නේ මුදල් නැති බවයි. පාළමක් හදන්නට රු. 1,000 ක් ඉල්ලුවොත් මුදල් නැති නිසා දෙන්නට බැහැ කියන එකයි ලැබෙන පිළිතුර. කොහොමද සල්ලි යන්නෙ ?

"ප්‍රදර්ශනයේදී බඩු නිකුත් කිරීම් හා සවිකිරීම් සම්බන්ධ විධිමත් ලේඛන නොතිබුණෙන් මෙම බඩු නැතිවීමත් මෙම මුදල් ප්‍රමාණයේ නිවැරදිතාවයත් සහතික කිරීමට නොහැකිය."

මේවා කොහේ ගිහිල්ලා තියෙනවාදැයි කියන්නට බැහැ.

**බී. වයි. තුඩාවේ මයා. (අධ්‍යාපන ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. பி. வை. துடாவே—கல்வி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. B. Y. Tudawe—Parliamentary Secretary to the Minister of Education)

කොයි කාලයේදීද ?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

1964 දී පැවැත්වුණු කර්මාන්ත ප්‍රදර්ශනය.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

කොයි කාලයේ වුණු දේද කියන එක නොවෙයි ප්‍රශ්නය. මහජනයා විශාල බලාපොරොත්තු පෙරදැරි කරගෙනයි


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

ආණ්ඩුවක් පිහිටුවන්නට ඡන්දය දෙන්නේ. එසේ පිහිටුවනු ලබන ආණ්ඩුවකින් තමන් පැතූ දේ නොලැබුණාම තවත් ආණ්ඩුවක් පිහිටුවන්නට ඒ උදවිය වෙනත් පිරිසකට ඡන්දය දෙනවා. එය ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක්. ඒ අයිතිය හැම දාම අපේ මහජනයාට තිබෙන්නට ඕනෑ. මෙවැනි වැරදි රජයේ සංස්ථාවකින් හෝ රජයේ ආයතනයකින් හෝ සිද්ධ වෙනවා නම් අපි සියලු දෙනාම ඒ ගැන සලකා බලා ඒ තත්ත්වය වෙනස් කරන්නට ඕනෑ. මහජනයා අපෙන් බලාපොරොත්තු වන්නේ එයයි. මේවා නිකම්ම අනුමත කළාම මහජනයා හිතන්නේ කිසිම අඩුපාඩුවක් නැතිව මේවායේ වැඩ කටයුතු කර ගෙන යනවා ඇත කියලයි. ඔක්කොම හොඳට කෙරෙනවායයි මහජනයා කල්පනා කරනවා.

" (අ) කර්මාන්ත ප්‍රදර්ශනය :

ප්‍රදර්ශනයේදී බඩු නිකුත් කිරීම හා සවිකිරීම සම්බන්ධ විධිමත් ලේඛන නොතිබුණෙන් මෙම බඩු නැතිවීමත් මෙම මුදල් ප්‍රමාණයේ නිවැරදිතාවයත් සහතික කිරීමට නොහැකිය......... මේ හේතුන් උඩ ප්‍රකාශනයෙහිදී ඇති සටහන් අපට නිවැරදි යයි පිළිගැනීමට නොහැකිය.

2. විකිණීම—කර්මාන්ත ප්‍රදර්ශනයෙහි විකුණුම් ශාලාවෙහි කරනු ලැබූ අලෙවිය සහතික කිරීමට උප පත්‍රිකා රිසිට් පත් හෝ දෛනික අලෙවිය වාර්තා හෝ පරීක්ෂණයට භාජනය කිරීම සඳහා නොතිබුණි."

ඊළඟට තොග නැතිවීම් ගැන සඳහන් වෙනවා. එහි වටිනාකම රුපියල් 52,917 යි. මෙන්න ඒ පිළිබඳ විස්තරය:

" සමීක්ෂක මණ්ඩලය විසින් කරන ලද වාර්ෂික හරිවැරදි බැලීමේදී අනාවරණය වූ වැරදිද, සමීක්ෂක මණ්ඩලයේ සටහන් ගලපමින් සහ තොග පාලන ගිණුමේ ශේෂයන්ගේ වෙනසද තොග සැසඳුම් ප්‍රකාශනය හා බැලීමේදී, හරිවැරදි බැලීමේ දී අනාවරණය වූ තොග අඩුවීම්වල ශුද්ධ වටිනාකම රු. 5,754.67 කි. තොග පාලන ගිණුම්වල සහ සමීක්ෂක මණ්ඩලයේ හරිවැරදි බැලීමේ සංඛ්‍යාවන් අතර ඇති වෙනසද, සමීක්ෂක මණ්ඩලයේ හරිවැරදි බැලීමේදී අනාවරණය වූ පහත දැක්වෙන වෙනස්වීම් ඇ ඡේදයේ (එ) (ඒ) යටතේ විස්තරාත්මකව ඇත."

ඊළඟට කර්මාන්ත ප්‍රදර්ශනයේ වියදම් ගැන සඳහන් වෙනවා. මේ එක එක කරුණු ගැන කියන්නට ගියොත් වෙන වෙනම පරිච්ඡේද ලියන්නට වුවත් පුළුවනි. වාසනාවකට මෙන් මෙම ගිණුම් පරීක්ෂාකර බලන්නේ පුද්ගලික ගණන් පරීක්ෂක වරුන් විසිනුයි. ඔවුන් කැමති නැහැ, තමන්ට තිබෙන ගෞරවය කෙලෙසා ගන්නට. එම නිසා මේවා ඔක්කෝම ඔවුන් ලියා දෙනවා. අපට මේවා ගැන මෙලෙසින් වත් සඳහන් කරන්නට අවස්ථාව ලැබෙන්නේ එම නිසායි. එසේ සිදු නොවෙනවා නම් අපට මෙවැනි දේ ගැන දැනගන්නවත් අවස්ථාවක් ලැබෙන්නේ නැහැ.

11 වන පිටුවෙහි මෙසේද සඳහන් වෙනවා :

" සේවක පාරිතෝෂික සංචිතය—රු. 33,340 :

මෙම වර්ෂයේ මුදල වන රු. 25,000 මාරු කිරීමට අමාත්‍යාංශයේ අනුමැතිය ලබා නැත."

ජේනවා නේද ස්වාධීනත්වය. කා යට නේද මෙය පාලනය වන්නේ ? මේ සඳහා අමාත්‍යාංශයේ අනුමතිය ලබාගෙනත් නැහැ. එතකොට ඇමතිතුමා තුට්ටුවකටවත් සලකා නැහැ. හිටපු අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා කර්මාන්ත ඇමති ධුරය උසුලද්දී මේවා ගැන සොයා බලා නැහැ. ඊළඟට මෙසේ සඳහන් වෙනවා.

" ඉඩම් සහ ගොඩනැගිලි—රු. 2,175,268 :

මීට අදාල ඉඩම් අත්කර ගැනීමේ නියෝගයන්හි පිටපත් අප පරීක්ෂා කළෙමු."

ආචාර්ය ඩබ්ලිව්. දහනායක

*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*

(Dr. W. Dahanayake)

අළුත් අයවැය ලේඛනයේදී තත්ත්වය කියාවි.

එම්. තෙන්නකෝන් මයා.

*(திரு. எம். தென்னகோன்)*

(Mr. M. Tennakoon)

අයවැය විවාදය එනතුරු අපි බලාගෙන ඉන්නවා හැම දෙයක්ම කියන්න. අයවැය විවාදයේදී අපට කතා කරන්නට ඉඩ ලැබෙන්නේ විනාඩි 15 යි.

තුඩාවේ මයා.

*(திரு. துடாவே)*

(Mr. Tudawe)

ඒක වෙනස් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය :

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

පාර්ලිමේන්තුව තියෙන්නේ කතා කරන්නට විතරයි. මෙය තියෙන්නේ වෙන මොන කෙහෙල්මලක් කරන්නද මා දන්නේ නැහැ. [බාධා කිරීමක්] අයවැය ඒවා දය දාට මේ වාර්තා ගැන දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන්නට බැහැ. ඇමතිවරයාගේ ප්‍රතිපත්ති ගැන පමණයි එදාට සාකච්ඡා කරන්නට ඉඩ තිබෙන්නේ. කාරක සභාවේ දීත් ලැබෙන්නේ සීමාසහිත කාලයක්. එම නිසා මෙවැනි අවස්ථාවලින් අප නියම ප්‍රයෝජන ලබා ගන්න ඕනෑ.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

දාහත් දවසක් තිබෙනවා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

හාමුන්නාන්සේ මොනවා කිව්වත් මට ඕනෑ තරම් කතා කරලයි මා නවතින්නේ. වාර්තාවේ 14 වන පිටුවේ මෙසේ සඳහන් වෙනවා :

**(ඇ) මිලදී ගැනුම් හා වියදම් දෛනික පොත**

මෙම ජර්නල්හි කර ඇති වාර්තා වර්ග කිරීමේදී නොයෙකුත් සුළු සුළු වැරදි සොයා ගත් අතර ඒවාට මාරු කිරීම් අවශ්‍යය. මේ පිළිබඳව මින් ඉදිරියට යම් කිසි පාලනයක් තිබිය යුතුයයි අපට හැඟේ.

**(ඈ) ලියකියවිලි ගොනු කිරීම**

ලියකියවිලි ගොනු කරන්නෙත් නෑ, දෙයියනේ මේ සංස්ථාව. ඇයි ? ලිපි ගොනු කළොත් මේ වැරදි සේරම පේනව නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

සභාපතිතුමනි, සභාවේ ගණපූරණයක් නෑ.

වාර්ෂික වාර්තාව (1964-65)

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති බව පෙනී ගියෙන්, බෙදුම් සීනු ගසද කිරීමට නියෝග කරන ලදී.**

**පසුව ගණපූරණයක් තුබුයෙන්—**

*சபை கணக்கிடப்பட்டு நிறைவெண் இல்லை யென்று கண்டதனால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப்பட்டது.*

*பிறகு, நிறைவெண் இருந்ததனால்—*

*House counted and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

සභාපතිතුමනි, ඔබතුමාගේ අණට කීකරුව හැකි තරම් ඉක්මනින් මගේ කතාව අවසාන කරනවා. තව කරුණු දෙකක් පමණයි මා සඳහන් කරන්නේ.

"ලියකියවිලි ගොනු කිරීම—පසුගිය වර්ෂවලදී ගිණුම් පිළිබඳ ලියකියවිලි ගොනු කිරීමේ ක්‍රමානුකූල ක්‍රමයක් පෙනෙන්නට නැත. අපගේ පරීක්ෂණ සඳහා අවශ්‍ය වවුචර විශේෂයෙන්ම ජර්නල් සටහන්වලට අදාල වවුචර සොයා ගැනීමේදී කාලය අපතේ ගිය අතර එය ඉතාමත් දුෂ්කර කාර්යයක්ද විය.

**(ඉ) නිවාඩු ලේඛණ**

1964 අප්‍රේල්-දෙසැම්බර් කාල සීමාව තුළ වැනරියේ සේවකයන් විසින් දෙන ලද නිවාඩු ඉල්ලුම් පත්‍ර අපගේ පරීක්ෂණය සඳහා නොතිබුණි."

නිවාඩු දෙනවා. ඒවා ගැන සටහන් වී නෑ.

"(ඊ) රු. 312,885.18 ක මුදලක් වන අපගේ චැක්පතින් පියවන කාල සීමාව සඳහා වවුචර නොමැත. මේවායේ ලැයිස්තුවක් පාලනාංශයට ඉදිරිපත් කර ඇත."

මේ විධියට මේ සංස්ථාවේ අඩුපාඩු ගැන දවසක් නොව සතියක් වුණත් කතා කරන්න පුළුවනි. අප මේවා ඉදිරිපත් කරන්නේ දීර්ඝ ලෙස කතා කරමින් කාලය ගත කිරීමට නොව මේ කරුණු මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීම සඳහායි. එසේ කරුණු ඉදිරිපත් කරන්නේ තත්ත්වය හොඳ අතට හරවා ගැනීම පිණිසයි. ඒ පැත්තට හෝ මේ පැත්තට හෝ වරද පෙරළා පොදු මහජනතාව තම්බන්න තලන්න පෙලන්න රවටන්න බෑ. මේ විධියට සල්ලි



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නාස්ති වන විට භාණ්ඩාගාරයේ මුදල් හිස් වෙනවා. ඒ බර කොහෙත් හෝ පෙරළී ඇවිත් පැටවෙන්නේ පොදු මහජනතාවගේ හිසට උඩයි. එම නිසා අපට වුවමනා කරන්නේ සංස්ථාවල සිදු වන මුදල් නාස්තිය නැවැත්වීමයි. මේ අමාත්‍යාංශය යටතේ සංස්ථා 22 ක් පමණ තිබෙන බව උප ඇමතිතුමා කිව්වා. ඒවායේ අඩුපාඩුකම්, රෝග, දෝස තිබෙන්නේ කොහේදැයි සෙවීමට පරීක්ෂණයක් කරන ලෙස මා උප ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එසේ පරීක්ෂණයක් පවත්වා මෙම සංස්ථාවල තත්ත්වය හොඳ අතට හරවා ගනිමින් ඉදිරියට යාමට අවස්ථාව එතුමා විසින් සලසා ගන්නවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

පූ. භා. 11.17

**සූරියාරච්චි මයා.**
*(திரு. சூரியாராச்சி)*
(Mr. Suriarachchi)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පිළිබඳ ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළ අදහස් ගැන අප ස්තුතිවන්ත වෙනවා. මේ වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නේ 1964 වර්ෂයේ අප්‍රේල් මාසයේ සිට 1965 වර්ෂයේ මාර්තු මාසය දක්වා වූ කාල සීමාව වෙනුවෙන්. සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ අඩුපාඩුකම් රාශියක් තිබෙන බව මේ වාර්තාව කියැවීමේදී අපට පෙනී යනවා. ඒ සමහර අඩුපාඩුකම් ගරු මන්ත්‍රීවරුන් විසින් පෙන්වා දෙන්නට යෙදුණා.

ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ අමු ද්‍රව්‍ය තත්ත්වය පිළිබඳව සඳහන් කළා. ඒ අඩුපාඩුකම් මකාලීමට දැන් පියවර ගෙන තිබෙන බව මතක් කරන්නට සතුටුයි.

කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ජේ. ඩී. වීරසේකර මයා.) කියා සිටියා—මීට අදාළ නොවුවත්—ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ මෙන් අනෙකුත් සංයුක්ත මණ්ඩලවලත් උපදේශක සභා පිහිටුවන්නය කියා. කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තිබෙන සියලුම සංයුක්ත මණ්ඩලවල



එවැනි උපදේශක සභා පිහිටුවීමට දැනට මත් කර්මාන්ත අමාත්‍යාංශය පියවර ගෙන තිබෙනවා. ළඟදීම ඡන්දය විමසීමා දිය කර ඒ කාර්යය සම්පූර්ණ කරනවා. මේ විෂයට අදාළ නොවුවත්, එතුමා කැළණියේ ටයර් සංස්ථාවේ නිපදවන ටයර්වල තත්ත්වය ගැනත් සඳහන් කරන්නට යෙදුණා. එක්තරා ප්‍රමාණයක වෙළඳ ප්‍රචාරයක් වන නිසා මා ඒ ගැනත් වචනයක් කියන්නට සතුටුයි. එක්තරා වකවානුවක දී—අපේ කාලයේ නොවෙයි ඊට කලින්—මේ ටයර්වලට වුවමනා කළ එක්තරා නූල් වර්ගයක හිඟයක් තිබුණු බවත් එම නිසා නිෂ්පාදනයේ දුර්වලතාවක් ඇති වූ බවත් රහසක් නොවෙයි. නමුත් ඒ අඩුපාඩුව දැන් මකා දමා තිබෙනවා. දැන් උසස් වර්ගයේ නූල් යොදා ඉතා උසස් තත්ත්වයකින් ඒ ටයර් නිෂ්පාදනය කරන බව මා මතක් කරන්නට සතුටුයි.

දකුණු කොළඹ පළමුවන ගරු මන්ත්‍රීතුමා (ජේ. ආර්. ජයවර්ධන මයා.)—විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා—මේ වාර්තා ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම ගැන සඳහන් කළා. ඇත්ත වශයෙන්ම මේ වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නේ 1969 ජනවාරි මාසයේ දීයි. මෙය සාකච්ඡාවට භාජන කිරීම සඳහා 1969 ජනවාරි 22 වන දින න්‍යාය පත්‍රයට ඇතුළු කර තිබෙනවා. විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ඒ කාලයේ වගකිවයුතු තනතුරක් දැරුවා. කෙසේ වෙතත්, ඒ අවස්ථාවේදී මෙය සාකච්ඡාවට භාජන වී නැහැ. එම නිසයි අපි නැවතත් මෙය ඉදිරිපත් කර තිබෙන්නෙ. වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම අවුරුදු පහ හය ප්‍රමාද වන බව ඇත්තයි. එවැනි ප්‍රමාදයන් වළක්වාලීමට අපි දැන් පියවර ගෙන තිබෙන බව මා මතක් කරන්නට සතුටුයි.

රත්ගම ගරු මන්ත්‍රීතුමා (මෙන්ඩිස් මයා.) රජයේ කර්මාන්ත ශාලා ගැනත් සංයුක්ත මණ්ඩල ගැනත් පැහැදිලි විස්තරයක් කරන්නට යෙදුණා. ඒ විස්තරයෙන් මෙතැන නැගූ ඇතැම් ප්‍රශ්නවලටත් පිළිතුරක් ලැබුණාය කියා මා කල්පනා කරනවා.

රඹුක්කන ගරු මන්ත්‍රීතුමාත් (ආනන්ද සිරිසේන මයා.) එක කාරණයක් ගැන මතක් කළා. ලංකා සම්භාණ්ඩ සංයුක්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මණ්ඩලය වෙළඳ නියෝජිතයන් සෑහෙන සංඛ්‍යාවක් පත් කර නැතැයි එතුමා කියන්නට යෙදුණා. අපි දැනටමත් ඒ ගැන ක්‍රියා කර ගෙන යනවා. ලංකාව පුරාම සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ වෙළඳ නියෝජිතයන් ඇති කරන්නට අප කට යුතු කරගෙන යනවා. ඒ අනුව බෙදා හැරීම සහ අලෙවිය පුළුල් කරන්නට වැඩ පිළිවෙළක් යොදා තිබෙන බවත් මා මතක් කරන්නට සතුටුයි.

මේ වාර්තාව හොඳ හැටි කියවා වැදගත් ඡේද කීපයක් උපුටා දක්වමින් නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා (එම්. පෙන්නා කෝන් මයා.) කළ කථාව ගැන අප ස්තුතිවන්ත වෙනවා. සංයුක්ත මණ්ඩලවල පවත්නා අඩුපාඩුකම් ඒ අන්දමට ප්‍රකාශ කිරීමෙන් ඒවා මකා ගන්නට අපට අවස්ථාව ලැබෙනවා. දැනට මේ සංයුක්ත මණ්ඩලයට අප අලුත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ අඩුපාඩුකම් සියල්ලක්ම ගැන අලුත් අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියා කරනවා ඇති.

ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය මගින් නිෂ්පාදනය වන පාවහන්— සපත්තු— අලංකාර නැත, විවිධ රටාවලට ඒවා නැත, යන චෝදනාවටත් අපට මුහුණ පාන්න සිද්ධ වී තිබෙනවා. ඒ දුර්වලකමත් නැති කිරීමට අප දැන් කටයුතු කරගෙන යනවා. අලුත් රටාවලට, අලුත් හැඩවලට, අලුත් පන්නයේ පාවහන් නිපදවීමට දැනටමත් ක්‍රියා කරගෙන යනවා. එම නිසා ඉදිරියේදී වෙළඳාම පුළුල් වී ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ පාවහන් වඩාත් ජනප්‍රිය වේවියයි අප විශ්වාස කරනවා.

ඒ සමගම, ස්වාමි සේවක දෙපක්ෂය අතර තිබෙන සම්බන්ධකම් වැඩි දියුණු කිරීම සඳහා අප අලුත් වැඩ පිළිවෙළවල් කීපයක් ආරම්භ කර තිබෙන බවත් මා මතක් කරන්නට සතුටුයි.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ ගනුදෙනු ප්‍රමාද වීම පිළිබඳව අමාත්‍යාංශයේ සැලකිල්ල තදින්ම යොමු වී තිබෙනවා. මේ වගේ ප්‍රමාදයන් වැළැක්වීමටත්, සංයුක්ත මණ්ඩලවල වාර්ෂික වාර්තා නියම වේලාවට මේ ගරු සභාවට සැපයීමටත් අවශ්‍ය පියවර ගන්නා බව මතක් කරන්න කැමතියි. මගේ පිළිතුර ප්‍රමාණවත්ය කියා මා විශ්වාස කරන බැවින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

**ගරු කේ. බී. රත්නායක**

*(கௌரவ கே. பி. ரத்நாயக்க)*

(The Hon. K. B. Ratnayake)

I move,

"That the House do now adjourn."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

පූ. භා. 11.23

**ප්‍රේමදාස මයා.**

*(திரு. பிரேமதாச)*

(Mr. Premadasa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු අධ්‍යාපන උප ඇමතිතුමා මේ අවස්ථාවේදී මෙහි පැමිණ සිටීම ගැන මා සතුටු වෙනවා. මට මේ ගැන කලින් දැනුම් දීමක් කරන්න නොලැබුණේ සභාව ඉක්මනටම විසිර යන නිසයි.

දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ සහතික පත් නොලත් ගුරුවරුන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවා තිබෙනවා. අගෝස්තු 28 වෙනිදා ගැසට් පත්‍රයේ එය පළ කර තිබෙනවා. මා හිතන හැටියට ඉල්ලුම් පත් යැවිය හැකි අන්තිම දිනය මේ මස 18 වෙනි දිනයි. එම ඉල්ලුම් පත්‍ර යැවීම සම්බන්ධයෙන් කොන්දේසියක් දමා තිබෙනවා. දැනට රජයේ සේවයේ, සංස්ථාවල, තනතුරුවල යෙදී සිටින අයට ඉල්ලුම් පත් දමන්න බැහැ. මා හිතන අන්දමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

එවැනි කොන්දේසියක් දමන්න ඇත්තේ අලුත් අයට රක්ෂාවල් ලබා දීමේ අදහසින් විය හැකියි. නමුත් මෙහි තිබෙන එක්තරා දුර්වලකමක්, අඩුපාඩුවක් මට පෙන්වන්න පුළුවනි. දැනට මෙවැනි ගුරු පත්වීම් ලබන්නට සුදුසුකම් තිබෙන උදවිය වෙනත් ස්ථානවල තමන්ගේ සුදුසුකම්වලට නොගැළපෙන රක්ෂාවල යෙදී සිටිනවා. සමහර විට කම්කරුවන් හැටියටද සේවය කරනවා. මට දැන ගන්න ලැබුණ හැටියට මේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේම මෙවැනි පදවිවලට සුදුසුකම් තිබෙන අය—සම්මාන 5 ක් 6 ක් ලබා සිටින අය—කම්කරුවන් හැටියට සේවය කරනවා. නමුත් ඒ අයට ඉල්ලුම් පත් දමන්න බැහැ. උපාධිධාරී ගුරුවරුන් තේරීමේදීත් මේ බාධාවට මුහුණ දෙන්න සිදු වී තිබෙනවා. දැනට යම් රක්ෂාවක, කම්කරු රක්ෂාවක හෝ උපාධිධාරියෙක් යෙදී සිටිනවා නම් තමන්ගේ අධ්‍යාපනික සුදුසුකම්වලට ගැළපෙන රක්ෂාවකට ඉල්ලුම් පත් දැමීමට අර තමුන් උසුලන රක්ෂාවෙන් අස් වෙන්න ඕනෑ. මා හිතන අන්දමට එයින් එක්තරා අසාධාරණයක් සිදු වෙනවා. වැඩි සුදුසුකම් තිබෙන අය තමන්ගේ සුදුසුකම්වලට නොගැළපෙන රක්ෂාවල යෙදී සිටිනවා නම් ඒ අයටත් අවස්ථාවක් දෙන්න ඕනෑ, තමන්ගේ සුදුසුකම්වලට ගැළපෙන ඇබෑර්තුවලට ඉල්ලුම් පත් දමන්න. පත්වීම ලැබුණාට පසුව ඔවුන්ට ඒ රක්ෂාවලින් අස් වෙන්න පුළුවනි. එවිට සුදුසුකම් අඩු අය එම රක්ෂාවල්වලට බඳවා ගන්න පුළුවනි. මා හිතන අන්දමට ඉල්ලුම් පත්‍ර කැඳවීම අවසන් කරන්නේ මේ මස 18 වෙනි දිනටයි. ගරු අධ්‍යාපන උප ඇමතිතුමා රුසියාවට ගොස් අලුත් අදහස්ද ඇති කර ගෙනයි ඉන්නේ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவே)*
(Mr. Tudawe)

මම රුසියාවට ගියේ නැහැ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

කෙසේ හෝ මා උප ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ මෙම අසාධාරණය නතර කරන ලෙසයි. ඒ සඳහා නියම පියවරක් ගන්නා මෙන් මම ඉතා ඕනෑකමින් ඉල්ලනවා.

පූ. භා. 11.26

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

ඒ ප්‍රශ්නය ගැන මමත් වචනයක් කියන්න ඕනෑ. ඒ ගරු මන්ත්‍රීතුමාගේ අදහස මා අනුමත කරනවා. තමුන්නාන්සේලා දන්නවා ඇති, පසුගිය අවුරුදු 5 ඇතුළත උපාධිධාරීන්ට ලබා තිබුණේ සෙනසුරු දසාවක් බව. උපාධිධාරීන්ගේ කිසිම අයිතිවාසිකමක්, සාධාරණ ඉල්ලීමක් ඉටු කර දුන්නේ නැහැ. ඒ අවුරුදු 5 ඇතුළත ඔවුන්ගේ ඉල්ලීම් ගැන කිසිම සැලකිල්ලක් දැක්වූයේ නැහැ. මා ඒ වරදට හවුල්කාරයෙක් වන්නේ නැහැ. පසුගිය අවුරුදු 5 ඇතුළත බොහොම අයුතු පිළිවෙලේ බොහොම වැරදි පිළිවෙලේ, ව්‍යාපාරයක් ගෙන ගියා. ඒ කාලය ඇතුළත තමන්ගේ අයිතිවාසිකම් ලබා ගත නොහැකි වුණ නිසා උපාධිධාරීන් තමන්ගේ සුදුසුකම්වලට නොගැළපෙන රක්ෂාවලට බැඳුනා. දැන් ඒ වැරදි හරිගැස්විය යුතු බවයි අපි කියන්නෙ. මැයි මස 27 වෙනිදා මේ රටේ ජනතාව ඒ වැරදි හරිගැස්වීමට අලුත් ආණ්ඩුවකට වරමක් දුන්නා. අපි ඒ ගැන බොහොම සන්තෝෂ වෙනවා. එසේ සන්තෝෂ වන අතර ඒ වැරදි නියම විධියට හරිගස්වන්න කියා අපි ඉල්ලා සිටිනවා. යම්කිසි පුද්ගලයෙක් තමන්ගේ සුදුසුකම්වලට නොගැළපෙන රක්ෂාවකට යන්නේ ඒ ස්ථානයෙන් ඉහළ යාමේ බලාපොරොත්තුවෙන්. සම්මාන 5 ක් තිබෙන තැනැත්තෙකුට සුළු රක්ෂාවක් ලැබුණාට පසුව සම්මාන දෙකක් තිබෙන අය ඊට ඉහළ රක්ෂාවකට යනවා නම්, සම්මාන 5 ගේ තැනැත්තාට ඒකට ඉල්ලන්න ඉඩක් නැත් නම්, එය මොන තරම් අසාධාරණයක්ද? ඉහළ යාමට සියලුම මනුෂ්‍යයන් ප්‍රාර්ථනා කරනවා නොවේද? එම නිසා දැනට රක්ෂා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙන අයට ඉල්ලුම් කරන්න බැරිය කියන කොන්දේසිය අසාධාරණ කොන්දේසියක්. එම නිසා ඒ කොන්දේසිය ඉවත් කර අධ්‍යාපන සුදුසුකම් තිබෙන සියලු දෙනාටම ඉල්ලන්න හැකි වන විධියට කටයුතු සලස්වන්න ඕනෑ.

මම බොහොම සන්තෝෂ වුණා, උපාධිධාරීන් පිළිබඳව අපේ ගරු මුදල් ඇමතිතුමා විසින් කරන ලද ප්‍රකාශනය ගැන. එතුමා කිව්වා, ලබන මස 1 වෙනිදා වන විට උපාධිධාරින් 2,500 ක් ගන්නවාය, අවුරුද්ද අන්තිමේදී තවත් 6,500 ක් ගන්නවාය, ඒ අනුව උපාධිධාරීන් 9,000 කට රක්‍ෂා ලැබෙන්න සලස්වනවාය කියා. ඒ කාරණය වාගේම මැද කොළඹ පළමුවන ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම කාරණය ගැනත් ගරු ඇමතිතුමා සොයා බලා ඒ කොන්දේසිය අස් කරන්නය කියා මම ඉල්ලනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමාට සහ මුදල් ඇමතිතුමාට මේ කාරණාව ගැන රජයේ වැදගත් වෘත්තීය සමිතියක් විසින් සන්දේශයක් එවා තිබෙනවා. උපාධිධාරීන්ට රක්‍ෂා දීගෙන යන අවස්ථාවේදී දැනට අඩු වැටුප්වලට වැඩ කරන උපාධිධාරීන්ටත් සුදුසුකම්වලට අනුව තැන දෙන්නය කියා ඒ මගින් ඉල්ලා තිබෙනවා. මේ කාරණා පෙන්වා දී තිබෙන නිසා ගරු අධ්‍යාපන උප ඇමතිතුමා කිසිම වාද විවාදයක් නැතිව මෙය පිළිගනීවිය කියා මා විශ්වාස කරනවා. බොහෝම ස්තුතියි.

පූ. භා. 11.30

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපන ඇමතිතුමා වෙත කලින් දැනුම් දී ඇති ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නටයි මා නැඟී සිටියේ. එනම් හලාවත අධ්‍යාපන කාර්යාලයේ ලඝු ලේඛිකා සෙ.මු.දෝ. ඇ. ජයකොඩි මහත්මිය ගැනයි. මේ කාරණය මම සවිස්තරව ඇමතිතුමා වෙත යොමු කර තිබෙනවා. අධ්‍යාපන උප ඇමතිතුමා මෙහි සිටින නිසා ඊට නිසි පිළිතුරු ලැබේවියයි මා විශ්වාස කරනවා.

ඉහළ ශ්‍රේණියේ ලඝු ලේඛිකා සෙ. මු. දෝ. ඇ. ජයකොඩි මහත්මිය 1970 අගෝස්තු 16 වැනි දින සිට ක්‍රියාත්මක වන සේ හලාවත අධ්‍යාපන දෙපාර්තමේන්තුවට මාරු කෙරෙන නියෝගය රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් නිකුත් කර ඇත්තේ 1970 අගෝස්තු 3 වැනිදායි. එම නියෝගයේ පිටපතක් හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යවා ඇති බැවින් ජයකොඩි මහත්මියට අගෝස්තු 16 වැනිදා සිට 31 වැනි දා දක්වා තම දෙපාර්තමේන්තුවෙන් වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය ලියකියවිලි ගෙන්වා ගන්නට හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකට යුතුකමක් තිබුණා. ඉන් පසුව දේශීය ආදායම් කොමසාරිස්, ජයකොඩි මහත්මියගේ වැටුපෙන් අඩු විය යුතු මුදල් පිළිබඳ විස්තාරයක් පමණක් හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂක වෙත යවා තිබුණා. එය ලැබුණු අවස්ථාවේදීවත් ඇය පිළිබඳ සෑසු විස්තර ගෙන්වා ගන්නට හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකට යුතුකමක් තිබුණා. අගෝස්තු 16 වැනි දින හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් වැඩ භාරගෙන පසුව නිවාඩු යන්නට ජයකොඩි මහත්මිය අදහස් කර තිබුණත් අගෝස්තු 14 වැනි දාම දරු ප්‍රසූතිය සඳහා රෝහලට ඇතුළු වන්නට ඇයට සිදු වුණා. එබැවින් අගෝස්තු 16 වැනි දිනැති ලිපියෙන් ඇය හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකට දැනුම් දුන්නා, තම ස්ථාන මාරුව එපරිද්දෙන්ම භාර ගත්තා බැවින් අගෝස්තු 14 වැනි දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවිකාවක වශයෙන් ඇරඹුණු තමාගේ ප්‍රසූත නිවාඩුව අගෝස්තු 16 වැනි දින සිට හලාවත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සේවිකාවක වශයෙනුත් අඛණ්ඩව භුක්ති විඳීමට තමාට ඉඩ ලැබෙන සේ අවශ්‍ය විධිවිධාන සලස්වන්නය කියා. ඇගේ එම ලිපිය ලැබුණු පසුව හෝ ඇයට නියමිත වැටුප් ගෙවීම සඳහා අදාළ ලියකියවිලි ගෙන්වා ගෙන කටයුතු කරන්නට හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ උත්සාහ කෙළේ නැහැ.

මේ කාරණයෙහිලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවත් තම වගකීම නොපිරිහෙළා ඉටු කළා යයි මා කියන්නේ නැහැ. ඇගේ වැටුපෙන් අඩු විය යුතු මුදල් ඇගේ අඩ මාසික වැටුපෙන් කපා ගැනීමට දේශීය ආදායම් කොමසාරිස් කටයුතු කර තිබුණු



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්. තෙන්නකෝන් මයා.]

නිසා, ඇගේ වැටුපෙන් කළ යුතු අඩු කිරීම් පිළිබඳ විස්තරයක් යැවීමට පළමුව ඇගේ වැටුප් හා නිවාඩු විස්තර ඇතුළත් පෞද්ගලික ලිපිගොනුව හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත වහාම යවමින් ඇගේ වෛද්‍ය සහතිකය ලැබුණු පසු ඉදිරිපත් කරන බව දන්වන්නට තිබුණා.

ඒ කෙසේ වෙතත් දේශීය ආදායම් කොමසාරිස් අගෝස්තු 25 වැනි දින ඇගේ වෛද්‍ය සහතිකය, වැටුප් හා නිවාඩු විස්තර ආදිය ඇතුළත් පෞද්ගලික ලිපිගොනුව හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යවා තිබෙනවා. ඇයට වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය ඒ සියලුම විස්තර ලැබුණු පසුවත් ඒ සඳහා උනන්දු නොවීම ගැන නම් හලාවත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන්ට නිදහසට කරුණු කියන්නට කිසිම ඉඩක් නැහැ. ඔවුන් ඇගේ වැටුප් ගෙවීමට කිසිම උනන්දුවක් නොගන්නා නිසා ඇගේ ස්වාමිපුරුෂයා සැප්තැම්බර් 7 වැනි දින හලාවත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ලිපිකරු හමු වී එම කාරණය පිළිබඳ තත්ත්වය විමසමින්, තමාගේ වැටුප් තව දුරටත් පමා නොකොට ගෙවන ලෙස දැක්වෙන ජයකොඩි මහත්මියගේ ලිපියකුත්, විවාහ දීමනාවට අදාළ සහතිකයකුත් භාර දී තිබෙනවා. දේශීය ආදායම් කොමසාරිස් යැවූ ලියකියවිලි නොසැලකිලිමත් අන්දමින් කොහේදෝ මුල්ලක දමා තිබෙන බවත්, ඒවා සොයා ගැනීමට අපහසු බවත් ඒ අවස්ථාවේදී දැන ගන්නට ලැබී තිබෙනවා.

මේක අතේ සල්ලි තිබිය යුතු වේලාවක්. ආණ්ඩුවේ සේවකයන්ගේ තත්ත්වය ගැන ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා මට වඩා හොඳින් දන්නවා ඇති. මාසයේ අවසන් කොටසේදී රජයේ සේවකයන් ජීවත් වන්නේ බොහොම අමාරුවෙන්. මේ මව දරු ප්‍රසූතිය සඳහා නිවාඩු ගොස් සිටියදී, අදාළ අර්ධ මාසය වෙනුවෙන් තමාට ලැබිය යුතු වැටුප ලබා ගන්නට බැරි නම් එය ඉතාමත්ම කනගාටුදායක කාරණයක්.

ඉතින් අර ලියකියවිලිවල පිටපත් දේශීය ආදායම් කොමසාරිස් වෙතින් ගෙන්වා ගෙන ඇයට වැටුප් ගෙවීමට කටයුතු කරන් නැයි ඇගේ ස්වාමිපුරුෂයා ඉල්ලා සිටියත් ඒ ගැනවත් සැලකිල්ලක් දැක්වූ බවක් පෙනෙන්නට නැහැ. තම කාර්ය මණ්ඩලයට අලුතින් පත් වී ආ ලඝු ලේඛිකාවකගේ වැටුප් ගෙවීම පවා මෙසේ නොසැලකිලිමත් අන්දමින් පැහැර හරිනවා නම් ගුරුවරුන් ගැන කොයි තරම් සැලකිල්ලක් දක්වනවා දැයි අපට හිතා ගන්නට පුළුවනි.

හැම වැඩක්ම කරවා ගන්නට හලාවත අධ්‍යාපන කාර්යාලයට යන්නට ඕනෑ යයි ඒ පැත්තේ ගුරුවරුන් නිතර නිතර අපට කියනවා. හලාවත සිටින අලුත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා සමහර විට මේ ඉහත කියන ලද කාරණය ගැන පෞද්ගලික වශයෙන් සැලකිල්ල යොමු කර නැතිව ඇති. හැම වැඩක්ම කර ගන්නට හලාවත අධ්‍යාපන කාර්යාලයට යන්නට සිදු වෙනවා යයි නිකවැරටිය ප්‍රදේශයේ ගුරුවරුන් කියන නිසා එතුමා දැන් අලුත් වැඩ පිළිවෙළක් යොදා තිබෙනවා. "හලාවත යන්නේ මොකටද ?" යනුවෙන් එතුමා ඇසූ විට ඒ ගුරුවරුන් ගෙන් එතුමාට ලැබුණු පිළිතුර, "හලාවත නොගොස් ලියුම් යැවීමෙන් පමණක් වැඩක් කර ගන්නට බෑ" යන්නයි. මේ තත්ත්වය අවබෝධ කර ගත් එතුමා මාස දෙකකට වරක් නිකවැරටිය කොට්ඨාශයේ "කොට්ඨාශ දිනයක්" පවත්වා ගුරුවරුන් සමඟ සාකච්ඡා කිරීමට වැඩ පිළිවෙළක් යොදා තිබෙනවා. ඒ තත්ත්වය යටතේ ගුරුවරුන්ට නැවත හලාවත අධ්‍යාපන කාර්යාලයට යන්නට වුවමනා වන්නේ නැහැ. ඉතින් කාර්යාලයට ගියත් මෙන්න ලැබී තිබෙන ප්‍රතිඵල. මේ යමක් කමක් කර ගන්නට පුළුවන් මහත්මයකුගේ භාර්යාවක්. ජයකොඩි මහත්මයා මෙම ගරු සභාවේම වැඩ කරන කෙනෙක්. මා මේ කාරණය හරි ගස්සන්ට ඒ මහත්මයා අධ්‍යක්ෂතුමාගේ සහකාර නිලධාරි මහතාට ටෙලිෆෝන් මඟින් දැනුම් දුන් විට, අද මේ කාරණය හරි ගස්සන්ට ඒ මහත්මයා පොරොන්දු වුණා. තව ටික වේලාවකින් මා නැවතත් ඒ ගැන විමසා බලනවා. ටෙලිෆෝන් කර ඒ වැඩේ කෙරී තිබෙනවාද නැද්දැයි සොයා බලනවා. ඒ වැඩේ කෙරී නැත්නම් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා කරුණාකර එය සකස් කර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 11.37

**තුඩාවේ මයා.**
*(திரு. துடாவே)*
(Mr. Tudawe)

නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද කාරණය ගැන සොයා බලා වැටුප් ගෙවන්නට තිබෙනවා නම් ඒක ඉක්මනින්ම ගෙවීමට කටයුතු කරන බව මා පළමුවෙන්ම කියන්නට කැමතියි.

මැද කොළඹ පළමුවැනි ගරු මන්ත්‍රීතුමාත් (ආර්. ප්‍රේමදාස මයා.) ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) ඉදිරිපත් කළ ප්‍රශ්නය ගැන ඊළඟට පිළිතුරු දෙන්නට කැමතියි. ඒ ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ ප්‍රශ්නය නම් ජ්‍යෙෂ්ඨ සමතුන් දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ ගුරුවරුන් හැටියට බඳවා ගැනීමට ක්‍රියා කිරීමේදී ඇති වී තිබෙන ප්‍රශ්නයක්. ඒ ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළේ දැනට රක්ෂාවල යෙදී සිටින අයට රක්ෂා දීමේ ප්‍රශ්නයයි. අපේ රජයත් අපේ අමාත්‍යාංශයත් ක්‍රියා කරන්නේ දැනට රක්ෂා නැති අයට රක්ෂා ලබා දීමටයි. අද තිබෙන ලොකුම උග්‍රම ප්‍රශ්නය තමයි රැකීරක්ෂා නොමැතිකමේ ප්‍රශ්නය. රක්ෂා නැතිකම නිසා බොහොම අමාරුවෙන් ජීවිත ගත කරන විශාල පිරිසක් ජ්‍යෙෂ්ඨ සමතුන් අතර සිටිනවා. අන්න ඒ අයට රක්ෂා ලබා දීමයි අපේ මූලික අදහස. තමුන්නාන්සේලා ඉල්ලන්නේ එය ක්‍රියාත්මක කිරීමේදී දැනට රක්ෂාවල යෙදී සිටින අයටත් ගුරුවරුන් වශයෙන් පත් වීමට ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්නය කියන එකයි.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ප්‍රශ්නය ඊට ටිකක් වෙනස්. ගුරුවරුන් හැටියට පත්වීමට සුදුසුකම් තිබෙන අය දැනට යම් යම් රක්ෂාවල යෙදී සිටිනවා. එමෙන්ම ගුරු තනතුරුවලට පත් වන්නට සුදුසුකම් ඇති, එහෙත් රක්ෂාවල යෙදී නැති අයත් විශාල සංඛ්‍යාවක් සිටිනවා. ඇත් සිදු වී තිබෙන්නේ, ගුරු තනතුරුවලට පත් වන්නට සුදුසුකම් ඇති, යම් යම් රක්ෂාවල යෙදී සිටින අය ඒ අයගේ ස්ථාන වසාගෙන සිටිනවා. ඒ නිසා කරුණාකර ඒ අයටත් මේවාට ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දෙන්න. එවිට ගුරු පත්වීම් සඳහා සුදුසුකම් නැති අයට කම්කරු ආදී ශ්‍රේණිවලට පත්වීමට අවස්ථාව ලැබෙනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவே)*
(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැනට ගුරුවරුන් හැටියට පත්වීමට සුදුසු අය රක්ෂාවල යෙදී සිටිනවාය කියන එකයි එතුමාගේ අදහස. ඇත්ත වශයෙන්ම එබඳු අය නැත කියන එකයි අපේ අදහස.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

මේ මන්ත්‍රී මණ්ඩලයේමත් සිටිනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவே)*
(Mr. Tudawe)

මන්ත්‍රී මණ්ඩලයේ සිටිනවා වෙන්න පුළුවන්. එහෙත් අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් සමත් වූ පමණින් ගුරුවරයෙක් වීමට සුදුස්සෙක් නොවේය කියන එකත් තමුන්නාන්සේ කල්පනා කරන්නට ඕනෑ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

අවශ්‍ය සුදුසුකම් තිබෙන අය සිටිනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவே)*
(Mr. Tudawe)

අවශ්‍ය සුදුසුකම් තිබෙන එක ඇත්තයි. එවැනි අයත් සිටිනවා. එමෙන්ම ඒ අතරේ සිටිනවා ගුරුවරුන් වීමට සුදුසුකම් නැති අයත්. ඇත්ත වශයෙන්ම අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයේ විෂයයන් කීපයකින් සමත්වීම පමණක් ගුරුවරයෙක් හැටියට බඳවා ගැනීමට සුදුසුකමක්ය කියා මා විශ්වාස කරන්නේ නැහැ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

මාත් එහෙම කියන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவே)*
(Mr. Tudawe)

එහෙනම් ප්‍රශ්නයක් නැහැනේ. දැනට අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් සමත් වී ගුරුවරයෙක් වීමට සුදුසු අය යම් යම් සේවාවල යෙදී සිටිනවාය කියන එක එතුමාත් පිළිගන්නේ නැහැ. එහෙනම් ප්‍රශ්නයකුත් නැහැ.

දැනට අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් සමත් වී යම් යම් විෂයයන්ගෙන් සම්මාන සහිතව සහතික පත්‍ර ලබා ගෙන රක්ෂාවක නිරතව සිටින අය ඒ ඒ දෙපාර්තමේන්තුවල උසස් තත්ත්වවලට පත්වීමට අවස්ථාව සැලසීමයි ඉතාම සුදුසු පියවර. ඔවුන් යම් යම් කරුණු උඩ යම් යම් දෙපාර්තමේන්තුවලට ඇතුලත් වුණා. ඇයි ඒ දෙපාර්තමේන්තුවල ඔවුන්ට තැනක් නොදෙන්නේ? අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් සමත් වූ අයට තිබෙන්නේ ගුරුවරුන් වීම පමණක්ද? මේ රටේ රාජ්‍ය භාෂාව සිංහල. ආණ්ඩුවේ කටයුතු කරන්නේ සිංහලෙන්. එහෙනම් අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් සමත් වී මේ මන්ත්‍රී මණ්ඩලයේ හෝ වෙනත් ආයතනයක යම් සේවකයෙක් සිටිනවා නම් ඔවුන්ට ඒ ඒ ආයතනවල ඉහළ තැන් දෙන්නට ඕනෑ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

යන්න තැනක් නැහැනේ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவே)*
(Mr. Tudawe)

එවැනි තැන් හදන්නට ඕනෑ. ඒ වැට කඩුළු කඩා සිංහල දැනීම ඇති සිංහල උගත්කම තිබෙන අයට මේ රටේ ඉහළ තනතුරුවලට යන්නට අවස්ථාව සලසා දෙන්නට ඕනෑ. අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ඒකයි. දැනටමත් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සුළු සේවකයින්ට ඉහළට යන්නට අවස්ථාව ලැබී තිබෙනවා. එමෙන්ම තව තවත් ඉහළට යන්නට අවස්ථාව දෙන්නට ඕනෑ. ඇයි එහෙම නොදෙන්නේ? හැම එක්කෙනාම අධ්‍යාපන දෙපාර්තමේන්තුවට දමන්නය කියන එක පුදුම කථාවක්නේ. අධ්‍යාපන දෙපාර්තමේන්තුව පමණක්ද සිංහල උගතාට තිබෙන තැන? ඇයි පළාත් පාලන අංශය? ඇයි සෞඛ්‍ය අංශය? ඇයි රාජ්‍ය සේවය? ඇයි සංයුක්ත මණ්ඩල? ඒ තැන්වලට යන්නත් ඔවුන්ට අවස්ථාව දෙන්න ඕනෑ. ඒවායේ ඔවුන්ට තැන නොදෙන්නේ ඒවා රටට අනවශ්‍ය සේවාද? අධ්‍යාපනයත් අවශ්‍යයි කියන එක පිළිගන්නවා. එමෙන්ම අපේ රටේ පැවැත්මට අනික් සේවාවනුත් අවශ්‍යයි.

ඒ ඒ ස්ථානවලම ඇති උසස් තනතුරුවලට පත්වන්නට සුළු සේවකයන්ට අපි සම්පූර්ණ අවස්ථාව සලසා දෙන බව මා මේ අවස්ථාවේදී සන්තෝෂයෙන් ප්‍රකාශ කරනවා.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ප්‍රශ්නය තේරුම් අරගෙන නොවෙයි කථා කරන්නෙ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவே)*
(Mr. Tudawe)

පැහැදිලි කරන්න.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

පිටරට ඉඳල ආව හැටියෙම නිසා ලංකාවෙ ප්‍රශ්න ටිකක් අමතකවෙලා යයි මා කලින් කිව්වෙ ඒ නිසයි.

**ගරු රත්න දේශප්‍රිය සේනානායක (වැඩ බලන ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා ඇමති)**
*(கௌரவ ரத்ன தேஷப்பிரிய சேனநாயக்க—பதில் திட்டமிடல், வேலைவாய்ப்பு அமைச்சர்)*
(The Hon. Ratna Deshapriya Senanayake—Acting Minister of Planning and Employment)

නැහැ. පිටරට හිටියේ සුමාන දෙක නිසා එහෙම වෙන්න බැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

වැඩබලන ක්‍රමසම්පාදන හා රැකීරක්ෂා ඇමතිතුමා කිව්ව දේවල් කියන්න පාර්ලිමේන්තු ලේකම්තුමාට සිද්ධ වුණේ ඒකයි.

**ගරු රත්න දේශප්‍රිය සේනානායක**
*(கௌரவ ரத்ன தேஷபிரிய சேனநாயக்க)*
(The Hon. Ratna Deshapriya Senanayake)

නැහැ. ඒ එතුමාගේ අදහස්.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

මේ ප්‍රශ්නය අවුල් කර දක්වන්නට එතුමා උත්සාහ කළා. ඔය ගුරු තනතුරුවලට ඉල්ලුම් කරන්නට සුදුසුකම් නැති විශාල පිරිසක් මේ රටේ සිටින බව ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා දන්නවා. ඒ උදවියගේ රැකීරක්ෂා ප්‍රශ්නයත් විසඳන්නට ආසාවක් තිබෙනවා නම් ඒ අයට පත්වන්නට පුළුවන් ශ්‍රේණිවලට ඇතුළු වී සිටින වැඩියෙන් සුදුසුකම් තිබෙන අයට නියම සුදුසුකම් ඇති ස්ථානවලට පත්වන්නට ඉඩ දෙන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவே)*
(Mr. Tudawe)

ඒ ඒ දෙපාර්තමේන්තුවලම ඉහළ තැන් ඔවුන්ට දුන්නාම ඒ තත්ත්වය ඇති වෙන්නෙ නැද්ද ?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

මේකත් එක දෙපාර්තමේන්තුවක්. තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවෙන් පටන් ගන්න. මම නිදර්ශනයක් දෙන් නම්. ගුරු පත්වීමක් ලබන්න සියලුම සුදුසුකම් තිබෙන යම් පුද්ගලයෙකු—

**තුඩාවේ මයා.**
*(திரு. துடாவே)*
(Mr. Tudawe)

මොනවද සුදුසුකම් ?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

තමුන්නාන්සේලා ඕනෑය කියන සියලුම සුදුසුකම්. සුදුසුකම් 10 ක් ඉල්ලනවා නම් ඒ 10 ම තිබෙන පුද්ගලයෙකු අද සාමාන්‍ය කම්කරු තනතුරක් දරනවා නම් ඒකෙන් වන අපරාධය බලන්න. මේ පුද්ගලයා ඔහු ලබා තිබෙන දැනුමට ගැළපෙන රක්ෂාවක් නොකරන නිසා ඔහු කරන්නේ කාලය නාස්ති කිරීමක්. ඒ සුදුසුකම් නැති නුපුහුණු පුද්ගලයෙකුට ඒ ස්ථානයට පත්වන්නට පුළුවන්. එහෙත් මා කලින් සඳහන් කළ පුද්ගලයා නිසා පසුව කී පුද්ගලයාට ඒ තැන ලැබෙන්නේ නැහැ. රැකීරක්ෂා ප්‍රශ්නය ඔය විධියට විසඳන්නට බැහැ. මා ඉල්ලා සිටින්නේ මේ වැට කඩුළු කඩන්න වැඩ භාර ගත් අය එසේ කරන්න කියායි. මේවා කඩන්න තුන් මාසය නම් මදි. ඕනෑ තරම් කාලයක් ගෙන කඩන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவே)*
(Mr. Tudawe)

ඔය මන්ත්‍රීතුමා කියන සුදුසුකම් තිබෙන රක්ෂා නැති උදවිය තවත් කොයිතරම් සිටිනවාද ?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

හුඟක් ඉන්නවා. එහෙත් මේ අයටත් ඉල්ලුම් කරන්ට අවස්ථාවක් දෙන්න. සුදුසුකම් ඇති රක්ෂා නැති කෙනෙකු ඉන්නවා නම් ඒ අයටත් දීම වෙන දෙයක්.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவே)*
(Mr. Tudawe)

අරයා ඉහළ යන විට මෙයාට දෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

එහෙම ඉවර වෙන්නෙ නැහැ. එහෙත් මේක අසාධාරණයි. ඇයි මේ බාධාව ඇති කර තිබෙන්නේ? මා කලින් කිව්ව විධියට යම් නුපුහුණු කම්කරු ශ්‍රේණියක උපාධිධාරියකු සිටිනවා නම් ඒ පුද්ගලයා එතැන තැබීමෙන් වෙනත් නුපුහුණු පුද්ගලයෙකුට රක්ෂාවක් ගන්න බැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

හිතන්න උපාධිධාරියකු නුපුහුණු රක්ෂාවක සිටිනවා කියා. ඔහුට ඒ දෙපාර්තමේන්තුවේ හෝ සංයුක්ත මණ්ඩලයේ හෝ උසස් තනතුරක් දීම සුදුසු නැද්ද?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

හොඳයි. ඉහළ යන්න ඒකෙ ඉඩක් නැත්නම් මොකද කරන්නෙ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඉඩක් දෙන්න ඕනෑ. ඉඩ දුන්නොයින් පසුව ඒ පුරප්පාඩුවට කෙනෙකු පත් කිරීමෙන් ගරු මන්ත්‍රීතුමා බලාපොරොත්තු වන අදහස ඉටු වෙනවා.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ඒක කරන්නෑ. ඇත් ඇයි ඒක නැවත් වන්නෙ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவே)*
(Mr. Tudawe)

තමුන්නාන්සේලා අවුරුදු පහක් තිස්සේ කරල මාස 3 ක් ගත වන විට අපට කියනවා, මේ සේරම වැඩවල් කඩා සම්පූර්ණ කරන්න කියා.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

අපි කරපු විධිය වැරදියි කියලයි තමුන්නාන්සේලා කරන්න පටන් ගන්නෙ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவே)*
(Mr. Tudawe)

තමුන්නාන්සේලා කරපු ක්‍රමය හරිද, වැරදිද කියන ප්‍රශ්නය නොවෙයි දැන් තිබෙන්නෙ. තමුන්නාන්සේලාට විසඳන්න බැරි වූ ප්‍රශ්න—

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ඉතින් තමුන්නාන්සේලා විසඳන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவே)*
(Mr. Tudawe)

අපි කරනවා. අපට කල් දෙන්න. මැතිවරණය ඉවර වුණු දවසෙ ඉඳලම, අපි වැඩ පටන් ගත් දවසෙ ඉඳලම, තමුන්නාන්සේලා අහන්නෙ "කෝ කළා? කෝ කළා?" කියලයි.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

මේ ප්‍රශ්නය උඩ වෙන හිතේ වේදනාවක් ගන්න වගෙයි හදන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

වෙන වේදනාවක් නොවෙයි. කිසි වේදනාවක් නැහැ. තමුන්නාන්සේලාට අවුරුදු 5 ක් තිස්සේ විසඳන්නට බැරි වූ ප්‍රශ්නයක් තුන් මාසයක් ගත වන්නටත් පෙර විසඳන්න කියන එකනෙ මේ ඉල්ලීම.

**ප්‍රේමදස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

අපි නොවෙයි තමුන්නාන්සේලාට කරදර කරන්නෙ; ඔය ඉස්සරහ ඉන්න වැඩ බලන ඇමතිතුමා වගේ අයයි. අපි තවම රුස්වීමක්වත් තිබ්බෙ නැහැ. එහෙත් උන්නැහේලා ආණ්ඩුව පිහිටෙව්ව හැටියෙම වගේ ගිහින් රුස්වීම් තබා "අරක විසඳන්න; මේක විසඳන්න" කියා කෑ ගසනවා.

**ගරු රත්න දේශප්‍රිය සේනානායක**
*(கௌரவ ரத்ன தேஷபிரிய சேனநாயக்க)*
(The Hon. Ratna Deshapriya Senanayake)

නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

එතුමා විතරක් නොවෙයි, අපිත් කියනවා.

**ප්‍රේමදස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

මේ ප්‍රශ්නය මතු කළේ දේශපාලන ප්‍රයෝජනයක් ලබා ගන්න නොවෙයි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

එතුමා බොහොම පවිත්‍ර චේතනාවකින් මෙය ඉදිරිපත් කළ බව මා දන්නවා.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

එහෙම නම් පවිත්‍ර චේතනාවෙන් ක්‍රියා කරන්නකො.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

හරි. අපට ක්‍රියා කරන්න ඉඩ දෙන්න.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

කරුණා කර මේ ලිපිගොනු ගෙන්වා බලා, ගැසට් පත්‍රය කියවා බලා, වගකිවයුතු පාර්ලිමේන්තු ලේකම්වරයකු හැටියට ක්‍රියා කරන්න. විරුද්ධ පාර්ශ්වයේ හිටපු කාලයේ තිබුණු වගකීමක් නැතිව කටයුතු කිරීමේ පුරුද්ද දැන් වගකියයුතු පදවියක් ගත්තට පස්සෙ අත්හරින්න ඕනෑ. එහෙයින් කරුණු සොයා බලා, සිදු වී ඇති මේ අසාධාරණය නැති කිරීමට ක්‍රියා කරන්න. ඒ සඳහා තමුන්නාන්සේලාගේ බලතල පාවිච්චි කරන්න. ඒ මිස පසුගිය කාලය ගැන මතක් කිරීමෙන් වැඩක් නැහැ.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

මම නිදර්ශනයක් ඉදිරිපත් කරන්නම්. ළඟදී නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට කණිෂ්ඨ සේවකයන් බඳවා ගත් අවස්ථාවේදී සම්මාන හතරක් හා ඊටත් වඩා ඇති 12 දෙනකු බඳවා ගත්තා. ඇත්ත වශයෙන්ම ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් අනුව ඊට වඩා ඉහළ තනතුරුවලට ඉදිරිපත් වීමේ අයිතිවාසිකම ඔවුන්ට තිබෙන්නට ඕනෑ. එහෙත් මෙහි සේවයට බැඳීම නිසා ගුරු පත්වීම් ඉල්ලීම් අයිතිය ඔවුන්ට නොලැබෙනවා නම් එය කොයි තරම් අසාධාරණයක්ද? එම නිසා ඔවුන්ට හිතෙනවා, මෙහි සේවයට බැඳුණේ නැත්නම් ගුරු පත්වීම් ලබා ගැනීමේ අවස්ථාව තිබුණ නොවේද කියා. අන්න එවැනි තත්ත්වයක් තිබෙනවා නම් එය අසාධාරණ නිසා, ඒ අසාධාරණය නැති කරන ලෙසයි ඉල්ලා සිටින්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவே)*
(Mr. Tudawe)
අසාධාරණය මොකක් ද ?

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)
මේ ගැන දිගින් දිගට තර්ක කරන්නට වුවමනා නැහැ. පාර්ලිමේන්තු ලේකම්තුමා කියන දේත් මා පිළිගන්නවා. එහෙත් මේ ප්‍රශ්නය ගැන ටිකක් කල්පනා කර බල නවා නම් යම්කිසි ප්‍රතිකර්මයක් යොදන්නට පුළුවනි.

**ගරු රත්න දේශප්‍රිය සේනානායක**
*(கௌரவ ரத்ன தேஷப்பிரிய சேனநாயக்க)*
(The Hon. Ratna Deshapriya Senanayake)
ඒ ගැන තමයි පාර්ලිමේන්තු ලේකම් තුමා පිළිතුරු දුන්නේ.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව පූ. භා. 11.50 ට, අද දින සභා සම්මතිය අනුව, 1970 සැප්තැම්බර් 24 වන බ්‍රහස්පතින්දා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.**

*அதன்படி மு.ப. 11.50 க்கு சபை அதனது அன்றைய தீர்மானத்துக் கிணங்க 1970 செப்ரெம்பர் 24, வியாழக்கிழமை மு.ப. 10 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.*

*Adjourned accordingly at 11.50 A.M. until 10 A.M. on Thursday, 24th September, 1970, pursuant to the Resolution of the House this day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපැලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදෙර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியையடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00), 6 மாதத்துக்கு அரைக்கட்டணம் ; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions: 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org